| 214 | ගාලු පාර 299/3 ස්ථානයේ නගර ශාලාව ඉදිරිපිට අතුරු පාර | ගාලුපාර | 299/3 | 685 ඒ කඩවීදිය උතුර | 185.36m | 6.0m |
| 215 | පරාක්‍රම මාවත අතුරු පාර 1 | පරාක්‍රම මාවත | ශ්‍රියා මාවත | 682බී ඇටඹගොඩ | 100.7m | 5.5m |
| 216 | මානෙල් මාවත 1 වන අතුරු මාර්ගය | මානෙල් මාවත | 5/19, 1/19, | 682 ඒ කුරුපුමුල්ල | 113.0m | 9.2m |
| 217 | කුරුපු මුල්ල සිංසැප මාවත ඇති අතුරු මාර්ගය | 75 | 73/3 | 682ඒ කුරුපුමුල්ල | 178.0m | 4.5/6.0m |
| 218 | උඩහමුල්ලේ වතුර ටැන්කිය ඉදිරිපිට අතුරු පාර | හිරණ පාර අංක 10 | 2/10 | 682 උඩහමුල්ල | 50.6m | 3.65m |
| 219 | උඩහමුල්ල සෝමානන්ද මාවත ඉදිරිපිට ඇති පටුමඟ | 174/ඒ | 174/5 174/10 බී | 682 උඩහමුල්ල | 125.3m | 3.65m |
| 220 | කුරුපුමුල්ල වරුණ මෙන්ඩිස් මාවත | 74, කුරුපුමුල්ල පාර | 58/88/8බී1 | 682ඒ උඩගමුල්ල | 193.3m | 4.5m |
| 221 | කුරුපුමුල්ල අතුරු මාර්ගය | 51, කුරුපුමුල්ල පාර | 158/B/5 | 682ඒ කුරුපුමුල්ල | 72.86m | 3.0/4.0m |
| 222 | තංතිරි මුල්ල අංක 182/2 සරත් පෙරේරා මහතාගේ නිවස අසලින් පටන් ගන්නා පටුමඟ | 97 තංතිරි මුල්ල | 97/1 තංතිරි මුල්ල | 681 තංතිරි මුල්ල | 97.0m | 4.25m |
| 223 | සිරිල් ජැන්ස් පලවන පටුමග වරිපනම් අංක 120 න් පටන්ගෙන 128/2 අවසන් මාර්ගය | සිරිල්ජැන්ස් පාර 120 | 128/2 | 682 උඩහමුල්ල | 99.0m | 3.35m |
| 224 | කුරුපුමුල්ල ශ්‍රී සුභද්‍රාරාම විහාරස්ථානය ඉදිරිපිට ඇති පටුමඟ | 187/2 ඒ කුරුපුමුල්ල | 187/1 | 682ඒ කුරුපුමුල්ල | 8134m | 4.0m |
| 225 | වීරමන් පාර 2 වන පටුමඟ | 27ඒ වීරමන් පාර | 27/5 | 682 බී ඇටඹගොඩ | 72.0m | 4.5m |
| 226 | වීරමන් පාර අවසාන අතුරු පාර | වීරමන් පාර | 47/3 | 682 බී ඇටඹගොඩ | 51.0m | 5.4m |
| 227 | වැකඩ සමඟි මාවත අතුරු පාර | සමඟි මාවත 142/36 | 142/35/ඒ | 687 වැකඩ බටහිර | 37.5m | 3.2m |
| 228 | දියරිල්ල වත්ත පාර | ගාලු පාර | 399/2 | 692 නල්ලුරුව උතුර | 115.3m | 3.65m |
| 229 | මොරවින්න පාර පළමු අතුරු පාර | මොරවින්න පාර 18/3 | 18/10 | 692 නල්ලුරුව උතුර | 87.4m | 4.5/3.7m |
| 230 | මැදවේල්ල පාර මහාමාත්‍ය විද්‍යාලය අසල පාර | මැදවේල්ල පාර | 24/12, 25/24 | 692 නල්ලුරුව උතුර | 202.7m | 3.0m |
| 231 | සංඝානන්ද මාවත හා ගලවැටි මෝදර පාර යාවන අතුරු මාර්ගය | වරිපනම් අංක 14 බී | වරිපනම් අංක 35 | 692 නල්ලුරුව උතුර | 155.8m | 5.1/6.0m |

| අනු. අංකය | මාර්ගයේ නම | මාර්ගයේ ආරම්භය | මාර්ගයේ අවසානය | ග්‍රාම නිලධාරී වසම | පාරේ දිග | පාරේ පළල |
|---|---|---|---|---|---|---|
| 232 | රොටරි පටුමඟ | ද සොයිසා පාර 187/ඒ | 191/9 | 692 නල්ලුරුව උතුර | 172.0m | 3.0m |
| 233 | සිරිල් ජැන්ස් මාවත ප්‍රයිම් ලැන්ඩ්ස් ඉඩම ඇතුලත පාර | සිරිල් ජැන්ස් මාවත | 177/20, 177/8 | 682 උඩහමුල්ල | 102m | 6.0/4.5m |
| 234 | නාලක අමරසිංහ මාවත 1 වන අතුරු මාර්ගය | සොලමන් මාවත | නාලක අමරසිංහ මාවත | 687 වෑකඩ බටහිර | 67.7m | 3.6m |

06-647

---

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ)වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වගන්ති ප්‍රකාරව දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනය දක්වා ඇති මාර්ග දික්වැල්ල ප්‍රාදේශීය සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2015.01.16 හා 2015.02.12 දරන සභා සම්මුතීන් අනුව තීරණය කර ඇත.

ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ අදාල මාර්ගවලට අදාල ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරෝධතාවයක් කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පලවූ දින සිට දින 30ක් තුලදී තමන්ගේ විරෝධතාව සාක්ෂි ඇතිව ලිඛිතව ප්‍රාදේශීය සභාව වෙත දැනුම් දීමට ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී කාලසීමාව තුල දැනුම් දීම ප්‍රකාරව ක්‍රියා නොකරන්නේ නම් විරෝධතා නොකරන ලද සේ සලකා මෙම *ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී උපලේඛනයේ සඳහන් මාර්ග දික්වැල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ගයන් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන බව මෙයින් දන්වමි.

එම්. එස්. රත්නවීර,
ලේකම්,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

2015 ජුනි මස 08 වැනි දින,
ප්‍රාදේශීය සභාව, දික්වැල්ල.

**උපලේඛනය**

| අනු. අංකය | මාර්ගයේ නම | මාර්ගයේ ආරම්භය | දකුණුපස ඉඩම් | වම්පස ඉඩම් | පාරේ දිග | පාරේ පළල |
|---|---|---|---|---|---|---|
| 01. | සමගි මාවත | දියගහගෙවත්ත | (i) මැදරුප්ප<br>(ii) මැදරුප්ප<br>(iii) මැදරුප්ප<br>(iv) මැදරුප්ප<br>(v) දියගහගෙවත්ත<br>(vi) ඉහළවත්ත<br>(vii) දියගහගෙවත්ත<br>(viii) උඩහවත්ත | (i) මැදරුප්ප<br>(ii) දියගහගෙවත්ත<br>(iii) මිරිස්වැලමණ්ඩිය<br>(vi) මිරිස්වැලමණ්ඩිය<br>(v) පදුරුගහකැල්ල<br>(vi) උඩහවත්ත | 134.68m | 2.44m |
| 02. | බෝගහකොරටුව පාර | සඳලුව මාවත | (i) එච්. එල්. රවිශාන් මහතාගේ ඉඩම<br>(ii) ගාමිණී කනිකාර මහතාගේ ඉඩම<br>(iii) එම්. බී ප්‍රේමරත්න මහතාගේ ඉඩම<br>(iv) රෙජිනා කවිරත්න මියගේ ඉඩම<br>(v) රංජිත් කවිරත්න මහතාගේ ඉඩම | (i) බෝගහකොරටුව<br>(ii) විජයදාස මහතාගේ ඉඩම<br>(iii) ගයාන් වික්‍රමරත්න මහතාගේ ඉඩම | 150 m | 5m |
| 03. | මිහිඳු මාවත | නාකුළුගමුව පාර | (i) සරත් මහතාගේ ඉඩම<br>(ii) සරත් මහතාගේ ඉඩම<br>(iii) කේ. එච්. ගුණවතී මියගේ ඉඩම | (i) කේ. එච්. විමලසේන මහතාගේ ඉඩම<br>(ii) කේ. එච්. පියසේන මහතාගේ ඉඩම<br>(iii) නිමල් ගුණතුංග මහතාගේ ඉඩම | 341m | 2.7m<br>3.5m |

| අනු. අංකය | මාර්ගයේ නම | මාර්ගයේ ආරම්භය | දකුණුපස ඉඩම් | වම්පස ඉඩම් | පාරේ දිග | පාරේ පළල |
|---|---|---|---|---|---|---|
| 04. | හතරවන පටුමග | මැන්ඩිස් මාවත | (i) ගුණදාස හෙට්ටිආරච්චි මහතාගේ ඉඩම<br>(ii) රංජිත් වීරසිංහ මහතාගේ ඉඩම<br>(iii) පියල් බන්දුල මහතාගේ ඉඩම<br>(iv) ලියනගේ පියරත්න මහතාගේ ඉඩම<br>(v) එච්. ආර්. සුසන්ත මහතාගේ ඉඩම<br>(vi) ඊ. ඩබ්. සුදත් ධම්මික මහතාගේ ඉඩම<br>(vii) ඒ. පී. පියදාස මහතාගේ ඉඩම | (i) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය<br>(ii) හේවගේ මහතාගේ ඉඩම<br>(iii) ඩබ්. එච්. පියදාස මහතාගේ ඉඩම<br>(vi) ගුණදාස හෙට්ටිආරච්චි මහතාගේ ඉඩම<br>(v) කේ. ඩී. ජගත් මහතාගේ ඉඩම<br>(vi) ඩබ්. සුමතිපාල මහතාගේ ඉඩම | 251.30 m | 4m |
| 05. | බණ්ඩාරවත්ත පාර | මැන්ඩිස් මාවත | (i) ජයසේන නිගමුනි මහතාගේ ඉඩම<br>(ii) ඩී. දයාපාල මහතාගේ ඉඩම | (i) එච්. ඩී. ගුණවීර මහතාගේ ඉඩම<br>(ii) ගාමිණී ජයසේකර මහතාගේ ඉඩම<br>(iii) එච්. ආර්. තුෂාර වසන්ත මහතාගේ ඉඩම | 58.17 m | 4.4m |

06-668

---

## බද්දේගම ප්‍රාදේශීය සභාව

261 වැනි අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දේගම ප්‍රාදේශීය සභාව විසින් 2014.02.21 දින පවත්වන ලද සභා රැස්වීමේදී පහත උපලේඛනයේ සඳහන් අංක 8.5 දරන යෝජනාව සම්මත කරන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අනුර අමරසිරි නාරංගොඩ,
සභාපති,
බද්දේගම ප්‍රාදේශීය සභාව.

2015 ජුනි මස 04 වැනි දින,
බද්දේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු,, 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ පළාත් සභාවේ පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013.05.17 දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, දකුණු පළාතේ සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 දින අංක 1878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පලකරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දාවූ ද, සම්මත අතුරු ව්‍යවස්ථාවල i සිට xxix දක්වා වූ කාණ්ඩ මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පලකරනු ලබන දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමට, ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ බද්දේගම ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නීය.

### අතුරු ව්‍යවස්ථා

01. සියළු සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදාල අර්ථ නිරූපනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා
02. සියළු සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදාල පොදු විධිවිධාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා
03. කිසියම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධානයන් හෝ නියමයන් උල්ලංඝනය කිරීම සම්බන්ධ දඬුවම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා
04. මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
05. මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
06. සිසිල්බීම කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා
07. කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා
08. බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා
09. කිරිපට්ටි පිළිබඳ අතුරු ව්‍යවස්ථා
10. පිහිනුම් තටාක පිළිබඳ අතුරු ව්‍යවස්ථා
11. අයිස් කර්මාන්තශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා
12. බත්කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ පිළිබඳ අතුරු ව්‍යවස්ථා
13. හෝටල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා
14. නවාතැන්පොලවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා
15. ලොන්ඩරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා
16. කර්මාන්තශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා
17. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා
18. සංචාරක වෙළඳුන් විසින් ආහාරපාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
19. පදික මාරු ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා
20. ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්තශාලා හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා
21. වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
22. මාර්ගවලට අලාභහානි කිරීම හා මාර්ගවල ගමනාගමනයට බාධා කිරීම වැලැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
23. ආදහනාගාර විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
24. පොදු වෙළඳපොල පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
25. ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථා
26. ප්‍රජා ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා
27. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා
28. උකස් හා උකස් හිමියන් ලියාපදිංචි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
29. වාර වාර්තා තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

06-798

# අතුරු ව්‍යවස්ථා

## කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය තුළ බත් කඩ, ආපන ශාලා, තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

252 හා අධිකාරිය වන 1947 අංක 16 දරන නගර සභා ආඥාපනතේ 267 වන වගන්තියේ පළවන උපවගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 272 වන වගන්තියේ (22) වන උපවගන්තියෙන් මහා නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව කුරුණෑගල මහා නගර සභාව විසින් සාදනු ලැබූ සහ 2014.09.30 දින පැවති එකී මහා නගර සභාවේ 4(10) දරන යෝජනාවෙන් සභා සම්මත වී ඇති මෙහි පහත උපලේඛනයෙන් දැක්වෙන කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය තුළ බත් කඩ, ආපන ශාලා, තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික) විධිවිධාන පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී මහ නගර සභා ආඥාපනතේ 268 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය දයාසිරි ජයසේකර වන ම විසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නීතිඥ ජේ. පී. දයාසිරි පද්මකුමාර ජයසේකර,
වයඹ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍ය,

2015 ජුනි මස 05 වැනි දින,
වයඹ ප්‍රධාන අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

උපලේඛනය

### කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය තුළ

### බත්කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. මෙම අතුරු ව්‍යවස්ථා කුරුණෑගල මහ නගර සභා ප්‍රදේශය තුළ බත්කඩ, ආපනශාලා, තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

අරමුණ

2. මහ නගර සභා ආඥාපනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහ නගර සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පවත්වාගෙන යාම අරමුණු කොටගෙන මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කොට ඇත.

අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

3. මහ නගර සභා ආඥාපනතේ 267(1) වගන්තිය සමග කියවිය යුතු 272 (22) උපවගන්තිය යටතේ මහ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත.

ඉටුකළ යුතු කාර්යයන්

4. මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ බත්කඩයකට, ආපනශාලාවකට, තේ හෝ කෝපි කඩයකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(1) ස්ථානය මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය,

(2) ස්ථානයේ සෑම කාමරයක ම බිත්ති මීටර් 2.5කට නොඅඩු උසකින් යුක්ත විය යුතු අතර එකී බිත්ති ගඩොලින්, සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් තබා තිබිය යුතු අතර දෙපැත්ත ම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය. එසේ වුව ද මුළුතැන්ගේ හැර වෙනත් කාමර ලීයෙන් හෝ කිසියම් ලෝහ තහඩු වර්ගයකින් හෝ ලී හා කිසියම් ලෝහ තහඩු වර්ගයකින් තනා තීන්ත ආලේප කර තිබීම මේ නියමයට අනුකූලවන ලෙස සැලකිය යුතු ය.

(3) ස්ථානයේ සෑම කාමරයක ම සීලිමක් බැගින් සවිකර තිබිය යුතු අතර එකී සීලිම පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(4) සෑම කාමරයකට ම විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කළ විට ඒ ජනේලවල කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ග ඵලයෙන් පහළොවෙන් එකකට නොඅඩු විය යුතු ය. එසේ වුව ද කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාළ නොවිය යුතු ය.

(5) වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු ය.

(6) පියසි කෙළවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2 කට උසින් පිහිටා තිබිය යුතු අතර අගු වාසිය අවම වශයෙන් මීටර් 1.5ක් විය යුතු ය.

(7) සෑම කාමරයකම බිම සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(8) ස්ථානය තුළ ජනනය වන කසළ රැස්කිරීම සඳහා කසළ භාජන තබා තිබිය යුතු අතර මුළුතැන්ගෙය තුළ තබන කසළ භාජන මැස්සන් හෝ වෙනත් කෘමි සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් තිබිය යුතු ය.

(9) ස්ථානය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමයන් අනුව ක්‍රියා කළ හැකි ආකාරයට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(10) ස්ථානයේ මුළුතැන්ගෙය තුළ පාවිච්චියට ගනු ලබන සෑම මේසයක් ම -

*(අ)* ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර, එකී මේසය මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මල නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

*(ආ)* යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා අති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර, මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මල නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(11) ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට තබා ඇති සෑම මේසයක් ම -

*(අ)* ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර, එකී මේසය මතුපිට වීදුරු තහඩුවකින් හෝ ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මල නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

*(ආ)* යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර වීදුරු තහඩුවකින් හෝ මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මල නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(12) ස්ථානයේ පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර අවම වශයෙන් සෑම මාස හයකට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතු ය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය ස්ථානයේ පාවිච්චිය සඳහා යොදා ගන්නේ නම් එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(13) ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තිබෙන්නේ නම් එසේ ගබඩාකර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(14) ගනුදෙනුකරුවන් විසින් පාවිච්චියට ගනු ලැබූ භාජන සේදීම සඳහා වෙනම කොටසක් ස්ථානයේ පවත්වාගෙන යා යුතු ය.

(15) ගනුදෙනුකරුවන්ගේ සහ සේවකයන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දහදෙනෙකුට එකක් බැගින් වනසේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වන වැසිකිළි හා කැසිකිළි තනා තිබිය යුතු ය.

(16) සෑම වැසිකිළියක හා කැසිකිළියක ම බිත්ති ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් හෝ මල නොබැඳෙන ලෝහ තහඩුවලින් තනා බිම සිමෙන්තියෙන් කපරාරුකර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය. එසේ ම තවදුරටත් ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් තැනූ බිත්ති වන විට ඒවා කපරාරුකර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු වන අතර මල නොබැඳෙන ලෝහ තහඩුවලින් තැනූ බිත්ති වනවිට ඒවා මතුපිට තීන්ත ආලේපකර තිබිය යුතු ය.

(17) ස්ථානයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ පාවිච්චිය සඳහා නාන කාමර ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු අතර (16) වැනි ඡේදයේ සඳහන් වැසිකිළිවලට අදාළ නියමයන් එකී නාන කාමරවල බිමට සහ බිත්තිවලට අදාළ විය යුතු ය.

(18) ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට වෙන්කළ කොටස තුළ ගනුදෙනුකරුවන්ගේ අත් සේදීමට මල නොබැඳෙන ලෝහ තහඩුවලින් හෝ පිඟන් මැටියෙන් තනා ඔපදැමූ හෝ ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් බැඳ පිඟන් ගඩොල් ඇල්ලූ බේසම් තනා තිබිය යුතු ය.

(19) ස්ථානයේ කවර හෝ කොටසක පාවිච්චියෙන් පසු බැහැර කරන අපජලය අවහිරයකින් තොරව ගලා යාමට සුදුසු කාණු පද්ධතියක් ඇතිකර තිබිය යුතු ය.

(20) මහ නගර සභාව විසින් ජලාපවහන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන්නේ නම් ස්ථානයෙන් බැහැර කරන අප ජලය මහ නගර සභාව විසින් නියම කරනු ලබන ආකාරයෙන් එකී ජලා පවහන පද්ධතියට ගලා යාමට සැලැස්විය හැකි අතර එසේ නොවන අවස්ථාවක එකී අපජලය උරා ගන්නා වලකට ගලා යාමට සලස්වා තිබිය යුතු ය.

(21) ස්ථානයේ සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු අතර ස්ථානයට විදුලිය සම්බන්ධතාව ලබාගෙන ඇත්නම් අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය.

(22) ස්ථානයේ තේ, කෝපි හෝ කිරි පිළියෙල කරනු ලබන කොටස පිරිද්දුම් නැති මල නොබැඳෙන ලෝහ තහඩුවකින් හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යකින් ආවරණය කර තිබිය යුතු ය.

5. තීන්ත ආලේපකර තිබිය යුතු යයි සහ 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමකර ඇති සෑම කොටසක ම අවම වශයෙන් අවුරුද්දකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

6. බලපත්‍රලත් ස්ථානය අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් ඇමදීම කළ යුතු අතර අපජලය බැසයන කාණු අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදුකර ජලයෙන් සෝදා හැරීම කළ යුතු ය.

7. බලපත්‍රලත් ස්ථානයේ ඇති වැසිකිළි සහ කැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර විෂබීජ නාශක යෙදීම කළ යුතු අතර, දුර්ගන්ධය වහනය වීමෙන් තොරව පවත්වා ගත යුතු ය.

8. බලපත්‍රලත් ස්ථානයේ ආහාර පාන පිළියෙල කිරීමට, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට සහ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට ගනු ලබන භාණ්ඩ, භාජන හා උපකරණ සෑම එකක් ම ඒවා පාවිච්චියට ගැනීමට පෙර පිරිසිදු ජලයෙන් සෝදා ගත යුතු අතර පාවිච්චි කිරීමෙන් පසුව සෝදා පිරිසිදු කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

9. බලපත්‍රලත් ස්ථානයේ ඒ ඒ කොටසේ එකතු වන සියලුම කසළ 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමකර ඇති ආකාරයෙන් වර්ගකර අපාරගම්‍ය ද්‍රව්‍යකින් තැනූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු අතර, එකී කසළ අවම වශයෙන් එක් වරක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් ඒ ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර, එකී භාජනවලට කසළ බහාලන අවස්ථාවේ දී හා ඉවත් කිරීමේ දී හැර අන් සියලු වේලාවන්වල දී එම භාජනය හොඳින් වසා තැබිය යුතු ය.

10. *(අ)* බලපත්‍ර ලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය,
(ii) වීදුරු,
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හා් පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ,
(vii) අන්තරාදයක අපද්‍රව්‍ය.

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

*(ආ)* ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ගකර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතු ය.

11. සෑම බලපත්‍රලත් ස්ථානයක් ම මීයන්ගෙන්, මැස්සන්ගෙන් හෝ වෙනත් කෘමීන්ගෙන් තොරව පවත්වා ගත යුතු අතර , එකී ස්ථානයේ තබා ගන්නා ආහාර හෝ පාන පිළියෙල කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය හා පිළියෙල කළ ආහාර හෝ පාන එකී සතුන්ගෙන් දූෂණයවීම වැළැක්වීමට අවශ්‍ය සියලුම විධිවිධාන සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

12. ගනුදෙනුකරුවන්ට ආහාර පිළිගැන්වීමේ දී ඒවා අතින් ඇල්ලීම නොකළ යුතු අතර එකී ආහාර පිළිගැන්වීම සඳහා හැන්දක් හෝ ගැරුප්පුවක් හෝ වෙනත් ආකාරයක උපකරණයක් යොදා ගත යුතු ය.

13. කවර හෝ බලපත්‍රලත් ස්ථානයක බාල කළ කිරි කිසිවක් තබා ගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතු ය. මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා බාල කළ කිරි යන්නෙන් ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයන් එකතු කළ කිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 85කට අඩු හෝ කිරි මේද සියයට 35කට අඩු එළකිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 9 ක හෝ කිරි මේද සියයට 7 කට අඩු මී කිරි අදහස් වේ.

14. බලපත්‍ර ලත් ස්ථානයේ ආහාර හෝ පාන පිළියෙල කිරීමේ නියුක්ත සෑම සේවකයෙකු වෙත ම පිළිවෑසුම් සපයා තිබීමත්, එකී සේවකයන් කාර්යයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී පිළිවෑසුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

15. බලපත්‍ර ලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහා ම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතු ය.

16. කුරුණෑගල මහ නගර සභාව විසින් නිකුත් කරනු ලබන උපලේඛන අංක 01 හි දැක්වෙන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් වාර්ෂික බලපත්‍රයක් ලබාගැනීම බලපත්‍ර ලාභියාගේ කාර්යය සහ වගකීම වන්නේය.

අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතු ය.

නොකල යුතු කාර්යයන්

17. නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් කුරුණෑගල මහා නගර සභා ප්‍රදේශය තුළ බත් කඩයක්, ආපනශාලාවක්, තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම නොකල යුතු ය.

18. බලපත්‍රලත් ස්ථානයෙන් ඉවත දමන කසල කවර හෝ අවස්ථාවක ස්ථානයේ බිම හෝ තැනින් තැන දැමීම නොකළ යුතු ය.

19. (අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන හා බීජ පෝෂණ කාලසීමාව ඉකුත්වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍ර ලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ඇ) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතු යි.

20. කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානය ඇතුළත දුම්බීම හෝ බුලත් සැපීම නොකළ යුතු ය.

අය කිරීම හා ගාස්තු

21. කිසියම් බත් කඩයක් පවත්වාගෙන යාම සඳහා මහ නගර සභා ආඥාපනතේ 247 (අ) 2 උපවගන්තියේ සඳහන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට සභාවට බලය ඇත්තේය.

බලය පැවරීම

22. මෙම අතුරු ව්‍යවස්ථාවේ කටයුතු නියාමනය අධීක්ෂණය හා පාලනය කිරීම සම්බන්ධයෙන් මහ නගර සභාව වෙත පැවරී ඇති එහි නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරී ම නිත්‍යානුකූල වන්නේ ය.

බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය

23. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතු ය.

පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය

24. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

25. නියමයක් යටතේ බලපත්‍ර ලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට පරීක්ෂා කිරීම සඳහා සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය. එසේම එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධාකිරීමක් නොකළ යුතු ය.

26. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් බත් කඩයක්, ආපන ශාලාවක්, තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

27. නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බලපත්‍රලත් ස්ථානයක පිළියෙල කරන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාක් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

28. අතුරු ව්‍යවස්ථාවේ 26 හි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය.

29. අතුරු ව්‍යවස්ථාවේ 26 හි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියමකර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියමකර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමසාරිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය

30. යම්කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචික මහා නගර සභාවේ නගරාධිපති නාගරික කොමසාරිස් හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබා දෙන්නේය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

31. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට, නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

දඩ හා දණ්ඩන

32. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේ ය.

33. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයන් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි (3) වගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි (3) වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

අර්ථ නිරූපනය හා නිර්වචන

34. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

"නගරාධිපතිවරයා " සහ "නියෝජ්‍ය නගරාධිපතිවරයා" යන යෙදුම්වලින් පිළිවෙලින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තෝරාපත් කර ගන්නා ලද නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා අදහස්වේ.

"මහ නගර සභාව" යන්නෙන්, කුරුණෑගල මහ නගර සභාව ද අදහස් වන්නේ ය.

"කොමසාරිස්වරයා" යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වන අතර ඒ සභාවේ යම් නියෝජ්‍ය හෝ සහකාර නාගරික කොමසාරිස්වරයෙක් සහ නාගරික කොමසාරිස්වරයා හෝ නියෝජ්‍ය හෝ සහකාර නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙක් ද කොමසාරිවරයාගේ බලතල කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥාපනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ . ඒ සභාවේ යම් නිලධාරියෙක් ද ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණයට ඊට ඇතුළත්වේ.

"ආපන ශාලාව හෝ බත් කඩය" යන්නෙන්, විකිණීම සඳහා පිසූ බත් සහ ව්‍යාංජන පිළියෙල කරන හෝ තබා ගන්නා හෝ ප්‍රදර්ශනය කරන ස්ථානයක් අදහස් වන අතර, ආහාර වේලක් සඳහා කෑමට සුදුසු වෙනත් කවර හෝ පිළියෙල කළ ආහාර වර්ගයක් හෝ කිසියම් කෙටි ආහාර වර්ගයක් විකිණීම සඳහා පිළියෙල කරන හෝ තබා ගන්නා හෝ ප්‍රදර්ශනය කරන ස්ථානයක් ද ඊට ඇතුළත් විය යුතු ය ;

"තේ හෝ කෝපි කඩය" යන්නෙන්, බේකරි නිෂ්පාදන හෝ වෙනත් කෙටි ආහාර සමග තේ හෝ කෝපි විකිණීම සඳහා පවත්වාගෙන යනු ලබන ස්ථානයක්,

"බලපත්‍රලාභියා " යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු ද,

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙහි කවර අතුරු ව්‍යවස්ථාවක නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම් ස්ථානයක් පාවිච්චි කිරීමටද එකී ස්ථානය ද

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් 'ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති,' කුරුණෑගල මහා නගර සභාවේ යම් නිලධාරියෙකු ද අදහස්වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස්වේ.

## උපලේඛනය

## කුරුණෑගල මහා නගර සභාව

### වෙළඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20........... වර්ෂය

1. කර්මාන්තය/වෙළඳාම හිමි කරුගේ නම : ...........................................

2. පෞද්ගලික ලිපිනය : ...........................................

3. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

4. දුරකථන අංකය ෘ ජංගම : ........................................... නිවාස : ...........................................

5. කර්මාන්තයේ/වෙළඳ ව්‍යාපාරයේ නම : ...........................................

6. කර්මාන්තයේ /වෙළඳාමේ ස්වභාවය : ...........................................

කර්මාන්තය/වෙළඳාම කරන ස්ථානයේ : ...........................................

(අ) ලිපිනය : ...........................................
(ආ) වීථියේ/පාරේ නම : ...........................................
(ඇ) වරිපනම් අංකය : ...........................................
(ඈ) දුරකථන අංකය : ...........................................

7. කර්මාන්තය/වෙළඳාම කරගෙන යන ස්ථානය අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය : ...........................................
කොට්ඨාසයේ නම : ...........................................

8. ව්‍යාපාර නාම ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් එහි යොමු අංකය : ...........................................

9. කර්මාන්තය/වෙළඳාම කරගෙන යන ස්ථානයේ කළමණාකරුගේ/නියෝජිතයාගේ නම : ...........................................

10. ජාතික හැඳුනුම්පත් අංකය ෘ

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

11. දුරකථන අංක ෘ ජංගම : ...........................................
නිවස : ...........................................

නාගරික කොමසාරිස්,
කුරුණෑගල.

ඉහත තොරතුරු සඳහන් කර්මාන්තය/වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථාන සඳහා 20............ වර්ෂය වෙනුවෙන් කර්මාන්ත/වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීතිවලට මම එකඟ වෙමි.

දිනය : .................

.....................................
ඉල්ලුම්කරුගේ අත්සන.

---

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ආදායම් පරීක්ෂක,

පසු පිටේ සඳහන් ඉල්ලුම්පත්‍රයට අදාළව වෙළෙඳ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණය හා නිර්දේශය කඩිනමින් මා වෙත ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

දිනය : 20...................

.....................................
නාගරික ගණකාධිකාරී

නාගරික ගණකාධිකාරී,

බලපත්‍රය ලබාදීම නිර්දේශ කරමි/නොකරමි.

.....................................
ආදායම් පරීක්ෂක.

---

ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/නාගරික ඉංජිනේරු,

පසුපිටේ සඳහන් ඉල්ලුම්පත්‍රයට අදාළව වෙළෙඳ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණය හා නිර්දේශය කඩිනමින් ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

.....................................
නාගරික ගණකාධිකාරී.

දිනය 20....................................

---

ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

අතුරු ව්‍යවස්ථා හා අනෙකුත් නීති රීතිවලට අනුකූලව සුදුසුකම් සපුරා ඇත. බලපත්‍රය නිකුත් කිරීම නිර්දේශ කිරීම සඳහා වාර්තා කරමි.

....................................
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

දිනය : 20.....................

නාගරික ඉංජිනේරු,

භාවිතය වෙනස් කර ඇත/නැත. අනුකූලතා සහතිකය ලබාගෙන ඇත/නැත. බලපත්‍රය නිකුත් කිරීම නිර්දේශ කිරීම සඳහා වාර්තා කරමි/නොකරමි.

....................................
කාර්මික නිලධාරී

දිනය ....................................

---

නාගරික ගණකාධිකාරී,

ඉහත ඉල්ලුම් පත්‍රයට අනුව අදාළ ස්ථානය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි/නොකරමි. (නිර්දේශ නොකරන්නේ නම් ඊට අදාළ හේතුව සඳහන් කරන්න.)

දිනය : ......................

...................................
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/නාගරික ඉංජිනේරු.

(නිල මුද්‍රාව තබන්න)

---

වෙළෙඳ බලපත්‍ර විෂයභාර නිලධාරී,

1. කර්මාන්තය/වෙළෙඳාම පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. ...................... කි.
2. කර්මාන්තය/වෙළෙඳාම පවත්වාගෙන යනු ලබන ස්ථානය වෙනුවෙන් හිඟ වරිපනම් අයකරගෙන ඇත/නැත.
3. කර්මාන්තය වෙළෙඳාම කරන ස්ථානයේ,

    *(අ)* වීථියේ /පාරේ නම : ......................
    *(ආ)* වරිපනම් අංකය : ......................

දිනය : ......................

...................................
වරිපනම් විෂයභාර නිලධාරී.

---

නාගරික ගණකාධිකාරී,

1. අයකළ යුතු බලපත්‍ර ගාස්තුව රු. ...................... කි.
2. බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය ....................................

...................................
වෙළෙඳ බලපත්‍ර විෂයභාර නිලධාරී.

නාගරික කොමසාරිස්,
ඉල්ලුම්පත්‍රය පිළිබඳ ඉහත නිර්දේශය සමඟ එකඟ වෙමි. බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

දිනය : ...................................

...................................
නාගරික ගණකාධිකාරී,
(නිල මුද්‍රාව තබන්න).

---

නාගරික ගණකාධිකාරි,

අනුමත කරමි.

දිනය ...................................

...................................
නාගරික කොමසාරිස්,
(නිල මුද්‍රාව තබන්න)

---

නාගරික ගණකාධිකාරි,

අයකරගත් බලපත්‍ර ගාස්තුව

රු. ...................................

ලදුපත් අංකය ................................... දිනය ...................................

පිළියෙල කළ බලපත්‍රයේ අංකය................................... දිනය ...................................

බලපත්‍රය ලබාගත යුතු ආයතන ලේඛනයේ සටහන් කර ඇත./ පරිගණකගත කර ඇත.

බලපත්‍රය නාගරික කොමසාරිස්ගේ අත්සනට ඉදිරිපත් කරමි.

දිනය ...................................

...................................
වෙළඳ බලපත්‍ර විෂය භාර නිලධාරි.

---

නාගරික කොමසාරිස්,

මෙම බලපත්‍රය පනවා ඇති වෙළඳ බලපත්‍ර ගාස්තු අයකිරීමේ ගැසට් පත්‍රයට අනුකූලව සකස් කර ඇත.

බලපත්‍රය අත්සනට ඉදිරිපත් කරමි.

දිනය ...................................

..................................
නාගරික ගණකාධිකාරි

---

නාගරික ගණකාධිකාරි

බලපත්‍රය අත්සන් කරන ලදී.

දිනය ..................................

.................................
නාගරික කොමසාරිස්/නාගරික කොමසාරිස්
වෙනුවට,
(නිල මුද්‍රාව තබන්න)

* අදාළ නොවන වචන කපා හරින්න.

06-645/1

## කුරුණෑගල මහ නගර සභාව

### කුරුණෑගල මහ නගර සභාවේ ආදාහනාගාරය විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

252 හා අධිකාරය වන 1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 267 වැනි වගන්තියේ පළවන උපවගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥාපනතේ 272 වැනි වගන්තියේ (13) වැනි උපවගන්තියෙන් මහ නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව කුරුණෑගල මහා නගර සභාව විසින් සාදනු ලැබූ සහ 2014.09.30 පැවැති එකී මහ නගර සභාවේ 4(01) දරන යෝජනාවෙන් සභා සම්මත වී ඇති මෙහි පහත උපලේඛනයෙන් දැක්වෙන කුරුණෑගල මහ නගර සභාවේ ආදාහනාගාරය විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික) විධිවිධාන පනතේ දෙවන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී මහා නගර සභා ආඥාපනතේ 268 වැනඅ වගන්තියේ (1) වැනි උපවගන්තිය ප්‍රකාරව වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍ය දයාසිරි ජයසේකර වන මවිසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නීතිඥ ජේ. පී. දයාසිරි පද්මකුමාර ජයසේකර,  
වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍ය,

2015 ජුනි මස 05 වැනි දින,  
වයඹ ප්‍රධාන අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

***කුරුණෑගල මහ නගර සභාවේ ආදාහනාගාර විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා***

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. මෙම අතුරු ව්‍යවස්ථා මහ නගර සභාවේ ආදහනාගාර විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

අරමුණ

2. මහ නගර සභාවේ ආදාහනාගාරය විධිමත්ව මහජනයාට පහසුකම් සපයමින් පවත්වාගෙන යාම මෙම අතුරු ව්‍යවස්ථාවේ අරමුණ වේ.

අතුරු ව්‍යවස්ථාව සම්පාදන සඳහා වූ නෛතික ප්‍රතිපාදන

3. මහ නගර සභා ආඥාපනතේ 267(1) උපවගන්තිය සමග කියවිය යුතු 272 වගන්තියේ (13) උපවගන්තිය යටතේ මහ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත.

ඉටුකළ යුතු කාර්යයන්

4. පහත 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන අවසර පත්‍රයක් ලබා ගැනීම අපේක්ෂා කරන (මෙහි මින්මතු "ඉල්ලුම්කරු" යනුවෙන් හඳුන්වනු ලබන) යම් තැනැත්තෙකු, මෙහි පහත දැක්වෙන ලේඛන සමග මෙහි දෙවන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ ඉල්ලුම්පත්‍රයක් නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

*(අ)* මියගිය තැනැත්තා හා ඉල්ලුම්කරු අතර සම්බන්ධතාව තහවුරු කිරීමට අදාළ කරගත හැකිවනු පිණිස -

(i) ඉල්ලුම්කරුගේ උප්පැන්න සහතිකය හෝ ජාතික හැඳුනුම්පත් හෝ ගමන් බලපත්‍රය හෝ රියැදුරු බලපත්‍රය

(ii) මියගිය අයගේ උප්පැන්න සහතිකය ; හෝ

(iii) මියගිය තැනැත්තා පදිංචි වී සිටි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ සහතිකය

ඉහත ඒවායින් සාක්ෂි 02ක්

*(ආ)* මියගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, එකී පරීක්ෂණය පවත්වන ලද මහෙස්ත්‍රාත්වරයා හෝ හදිසි මරණ පරීක්ෂකවරයා විසින් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 41(ඉ) ඡේදය යටතේ මෘත ශරීරය ආදාහනය කිරීමට අවසර දෙමින් නිකුත්කළ සහතිකය හෝ අජීවී උපතකින් බිහිකළ මෘත ශරීරයක් නම් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 43(ආ) ඡේදය යටතේ නිකුත් කළ සහතිකය, සහ

*(ඇ)* මියගිය තැනැත්තාගේ මරණය සනාථ කෙරෙන පහත සඳහන් ලියවිලි/සහතික.

(i) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ලේකම්තැනගේ -

1. මරණ ලියාපදිංචි කිරීමේ ලේඛනය ලි.ප.බි. 2,
2. මරණ සහතික ලි.ප.බි. 67,
3. මරණ දැන්වීම් සහතිකය (41(1)(අ) ලි.ප.ලි.බි. 16,

4. මරණ ලියාපදිංචි කිරීමේ සහතිකය ලි.ප.බි. 20,
5. පළාතේ ග්‍රාම නිලධාරීගේ වාර්තා පොතේ ලි.ප.බි 24,
6. රජයේ වෛද්‍යවරයාගේ මරණ ප්‍රකාශය ලි.ප.බි. 33,
7. මරණ පරීක්ෂකතැනගේ සහතිකය (39(1) සහ (41(1)(උ) වගන්තිය ලි.ප.ලි.බි.18,
8. මහෙස්ත්‍රාත්තුමා විසින් ලිඛිතව නිකුත් කරනු ලබන සහතික,
9. විදේශ රටක දී මිය යාමක දී ලබාදෙනු ලබන සහතික,
10. සති 28ට අඩු දරු උපත් ගැන මව/රැකබලාගන්නා/පෞද්ගලික හෝ රජයේ වෛද්‍යතුමන්ලා විසින් නිකුත් කරනු ලබන ලිඛිත නියෝගය.

5. *(අ)* නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් නොමැතිව මහ නගර සභාවට අයත් කිසියම් ආදහනාගාරයක කවර හෝ මෘත ශරීරයක් ආදාහනය නොකළ යුතු ය නොකළ යුතු කාර්යයන්

*(ආ)* මියගිය යම් තැනැත්තෙකුගේ මරණය සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත යටතේ මහේස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්‍ෂකවරයකු විසින් පරීක්ෂණයක් පවත්වනු ලැබ, එකී පරීක්ෂණය අවසානයේ මෘත දේහය ආදාහනය කිරීමට එකී මහේස්ත්‍රාත්වරයා හෝ හදිසි මරණ පරීක්‍ෂකවරයා අවසරයක් දී ඇත්තේ නම් මිස, එකී මෘත දේහය ආදාහනය කිරීමට භාර ගැනීම හෝ ආදාහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් නොකළ යුතු ය.

*(ඇ)* මියගිය යම් තැනැත්තෙකුගේ මරණ සහතිකයේ 7 වැනි තීරුවේ "මරණයට හේතුව හා භූමදාන හෝ ආදාහනය කළ ස්ථානය" යන්නෙහි මහ නගර සභාවේ අදාළ ආදහනාගාරය නම්කර සඳහන්ව ඇත්තේ නම් මිස, එකී මෘත දේහය ආදාහනය කිරීමට භාර ගැනීම හෝ ආදාහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් නොකළ යුතු ය. නමුත් හදිසි නොවැලැක්විය හැකි හේතුවක් පහත අවස්ථාවක දී නාගරික කොමසාරිස්වරයාට තීරණ ගත හැක.

6. නිකුත් කළ අවසර පත්‍රයේ නිරූපිත වේලාවට හෝ ඊට පෙර මෘත දේහය ආදාහනාගාර භාරකරුට භාරදිය යුතු ය. එකී වේලාවට මෘත දේහය භාර දීමට ප්‍රමාද වීම හේතුවෙන් ඉල්ලුම්කරුට හෝ මියගිය තැනැත්තාගේ අයිතිවාසිකම් ඇති වෙනත් යම් තැනැත්තෙකුට සිදුවන යම් අපහසුතාවයක් හෝ අලාභයක් සම්බන්ධයෙන් මහා නගර සභාව, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා හෝ බලයලත් නිලධාරියා වගකීමට යටත් නොවිය යුතු ය.

7. *(අ)* කිසියම් ආදාහනාගාරයක, ආදාහන කුටීරයට මෘත දේහය ඇතුල්කර එහි ආරක්ෂිත දොර වසා දැමීමෙන් පසුව කුටීරය ආවරණය කළ කොටසට ආදාහනාගාර භාරකරු හෝ ඔහුගේ සහායකයන් හැර වෙනත් යම් තැනැත්තෙකු ඇතුල්වීම නොකළ යුතු ය.

*(ආ)* නාගරික කොමසාරිස්වරයාගේ, බලයලත් නිලධාරියාගේ හෝ ආදාහනාගාර භාරකරුගේ අවසරය නොමැතිව යම් ආදාහනාගාර පරිශ්‍රයකට ඇතුල්වීම නොකළ යුතු ය.

*(ඇ)* (ආ) ඡේදයේ කුමක් සඳහන්ව තිබුණ ද -

(i) මෘත දේහයක් ආදාහනය කිරීමට යම් තැනැත්තෙකු අවසර පත්‍රයක් ලබා ඇත්තේ නම්, මෘත දේහය ආදාහනය සඳහා භාරදීමට ඔහු හෝ ඔහුගේ බලයලත් තැනැත්තකු සමග එකී අවස්ථාවට සහභාගීවන වෙනත් යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් ; සහ

(ii) ආදාහනය කරන ලද යම් මෘත දේහයක භෂ්මාවශේෂ භාර ගැනීමට නියමිත දින හෝ එදිනට පෙර, අවසර පත්‍රය ලබා ඇති තැනැත්තා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා සමග පැමිණෙන වෙනත් යම් තැනැත්තෙකු හෝ තැනැත්තන්.

ආදාහනාගර පරිශ්‍රයට ඇතුල්වීමට අවසරය ලැබී ඇති තැනැත්තන් ලෙස සලකනු ලැබිය යුතු ය.

8. යම් ආදාහනාගාර පරිශ්‍රයක් තුළ -

*(අ)* සාමය කඩවන ආකාරයෙන් හැසිරීම,

*(ආ)* ආදාහනාගාර පරිශ්‍රය තුළ ඇති මහ නගර සභාවට අයත් දේපළවලට අලාභහානි කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම,

*(ඇ)* ආදාහනාගාර භාරකරුගේ හෝ ඔහුගේ යම් සහායකයෙකුගේ රාජකාරියට බාධා කිරීම.

පළාත් පාලන ආයතනයේ කාර්ය භාරය

9. (අ) මෘත ශරීරයක් ආදාහනය කිරීමට අයකරන ගාස්තු කාර්යභාරය මහ නගර සභාවේ යෝජනා සම්මතයක් මගින් නියම කරනු ලැබිය හැකි අතර, එවැනිම යෝජනා සම්මතයක් මගින් එකී ගාස්තු කලින් කල සංශෝධනය කළ හැකි ය ;

(ආ) ඉහත (අ) ඡේදය යටතේ පනවනු ලබන හෝ කලින් කල සංශෝධනය කරන ගාස්තු ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ආදාහනාගාරය වෙන් කරවා ගැනීමට අයදුම්පත් භාර ගන්නා ස්ථානයේ සහ ආදාහනාගාරයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීම ද කළ යුතු ය;

(ඇ) මෘත ශරීරයක් ආදාහනය කිරීමට අයකරන ගාස්තු මෙහි පළමුවැනි උපලේඛනයේ දැක්වෙන වර්ගීකරණය යටතේ පනවනු ලැබිය හැකි ය.

10. මෘත ශරීරයක් ආදාහනය කිරීමට අවසර පත්‍රයක් ඉල්ලා ඉදිරිපත් කෙරෙන ඉල්ලුම්පත්‍රයක් මත අවසර පත්‍රයක් නිකුත් කිරීමට තීරණය කරන ලද්දේ නම්, එවැනි අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව මෙහි තුන්වැනි උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ ලේඛනයක ලේඛනගත කිරීම නාගරිකකොමසාරිස්වරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය වන්නේ ය. මේ ලේඛනය අයදුම්පත් භාරගන්නා මහ නගර සභාවේ කාර්යාලයේ පවත්වා "ගත යුතු ය.

11. ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයකට අනුව යම් මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා භාර ගැනීමට තීරණය කරන ලද්දේ නම්, 9 වැනි අතුරු ව්‍යවස්ථාවට අනුව පනවන ලද නියමිත ගාස්තුව අයකර ගැනීමෙන් පසුව, නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඒ සඳහා වන අවසර පත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. එකී අවසර පත්‍රයට අනුව ආදාහනය කිරීමට නියමිත මෘත ශරීරය ආදාහනාගාර භාරකරු වෙත ගෙනැවිත් භාරදිය යුතු දිනය හා වේලාව එකී අවසර පත්‍රයෙහි පැහැදිලිව සටහන් කර තිබිය යුතු ය.

12. කිසියම් හේතුවක් මත ආදාහනය කිරීම සඳහා මෘත ශරීරයක් භාර නොගන්නේ නම්, නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඊට හේතුවූ කරුණු ද සමග ඒ බව වහාම ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

13. සතියේ සෑම දිනකම පෙරවරු 7.00 සිට පස්වරු 7.00 දක්වා කාලය ඇතුළත ආදාහනය කිරීම සඳහා මෘත ශරීර භාර ගැනීම හා ආදාහනය කිරීම කළ හැකි ය.

14. සෑම ආදාහනාගාරයකම ආදාහනය කරන ලද එක් එක් මෘත දේහය සම්බන්ධයෙන් සිව්වැනි උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද ලේඛනයක් සුසාන භූමි භාරකරු /ආදාහනාගාර භාරකරු ආදහනාගාර යන්ත්‍ර ක්‍රියාකරු විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

15. (අ) මෘත ශරීර ආදාහනය කිරීමට සුදුසු තත්ත්වයකින් ආදාහනාගාර නඩත්තු කිරීම හා පවත්වාගන යාම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය;

(ආ) යම් ආදාහනාගාරයක් ප්‍රතිසංස්කරණය කිරීමේ හෝ නඩත්තු කිරීමේ කාර්යය සඳහා එකී ආදාහනාගාරය වසා තබන්නේ නම්, ඒ පිළිබඳ නිවේදනයක් භාෂාත්‍රයෙන්ම මෘත දේහ ආදාහනය සඳහා අවසරපත් නිකුත් කරන කාර්යාලයේ සහ ආදාහනාගාර පරිශ්‍රයට ඇතුල්වන ස්ථානයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

අයකිරීම් හා ගාස්තු.

16. 251 අ(1) මහ නගර සභා ආඥා "පනතේ විධිවිධාන යටතේ හෝ මේ ආඥාපනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක්, රීතියක් හෝ නියෝගයක් යටතේ යම් බද්දක්, කුලියක්, මුදලක්, ගාස්තුවක් හෝ වෙනත් ගෙවීමක් මහ නගර සභාවට අය විය යුතුව තිබෙන අවස්ථාවක, එහි යම් විධිවිධානයක හෝ එකී අතුරු ව්‍යවස්ථාවක, රීතියක හෝ නියෝගයකට පටහැනි කුමක් වුව ද, ඒ බද්ද දඩ මුදල, දඬුවමක් වශයෙන් වූ ගෙවීම, ගාස්තුව හෝ වෙනත් ගෙවීම අය කරගෙන එය මහ නගර සභාවේ අරමුදල්වලට බැර කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

බලය පැවරීම

17. මෙම අතුරු ව්‍යවස්ථාවට අදාළ කටයුතු නියාමනය කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් මහ නගර සභාව වෙත පැවරී ඇති බලය එහි නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් සුසාන භූමිපාලක හෝ ආදාහනාගාර භාරකරු වෙත ලිඛිතව පවරා දීම නීත්‍යනුකූල වන්නේ ය.

පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය.

18. (අ) සෑම මෘත දේහයක්ම ආදාහනය කර පැය හැත්තෑ දෙකක් ගතවීමට මත්තෙන් ඉල්ලුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකු විසින් එකී මෘත දේහයේ භෂ්මාවශේෂ භාරගත යුතු ය;

(ආ) එසේ වුව ද ඉල්ලුම්කරුගේ ලිඛිත ඉල්ලීමක් මත සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් එකී භෂ්මාවශේෂ ආදාහනාගාර භාරකරුගේ භාරයේ තබා ගන්නා කාල සීමාව දීර්ඝ කිරීම කරනු ලැබිය හැකි ය;

(ඇ) (ආ) ඡේදය යටතේ භෂ්මාවශේෂ ආදාහනාගාර භාරකරුගේ භාරයේ තබා ගැනීමට දීර්ඝ කරන කාලය, ආදාහනය සිදු කළ දින සිට දින 14කට නොවැඩි විය යුතු ය;

(ඈ) එසේ භෂ්මාවශේෂ ඉවත් කර ගැනීමට ඉඩදෙන ලද කාලය අවසන්වීමෙන් පසුව ද ඉවත් කර නොගත් භෂ්මාවශේෂ බැහැර කිරීමට නාගරිකකොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියාට හෝ ආදහනාගාර භාරකරුට බලය තිබිය යුතු ය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේ ය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම. දඩ හා දණ්ඩන.

20. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් කඩකිරීම, උල්ලංඝනය කිරීම, පිළිබඳ වූ වරදක් සම්බන්ධයෙන් නිසි අධික්ෂණය බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරිය වූ මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියේ (3) වන උපවගන්තියේ දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරනු ලබන යම් තැනැත්තකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී 267 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

21. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ -

අර්ථ නිරූපනය හා නිර්වචන.

"නගරාධිපතිවරයා " සහ "නියෝජ්‍ය නගරාධිපතිවරයා" යන යෙදුම් වලින් පිළිවෙලින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවල ට අනුකූලව තෝරාපත් කර ගන්නා ලද මහ නගර සභාවේ නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා අදහස්වේ ;

"නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වන අතර, ඒ සභාවේ යම් නියෝජ්‍ය හෝ සහකාර නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙක් ද කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥා පනතින් හෝ ඒ යටතේ බලය පවරනු ලැබූ යම් නිලධරයෙක් ද ඒ නිලධරයාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණයට ඊට ඇතුළත්වේ ;

"මහ නගර සභාව" යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාව ද අදහස් වේ;

"බලයලත් නිලධාරී" යන්නෙන්, තත්කාර්ය සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ කුරුණෑගල මහා නගර සභාවේ සුසාන භූමි පාලක හෝ ආදාහනාගාර භාරකරු අදහස් වේ;

"ආදාහන කුටීරය" යන්නෙන්, ආදාහනය කිරීම සඳහා මෘත දේහය තැන්පත් කරන කුටීරය සහ එකී කුටීරයට පිටතින් සාදන ලද බාහිර කුටීරය ද;

"ආදාහනාගාර පරිශ්‍රය" යන්නෙන්, සම්පූර්ණ ආදාහනාගාරය සහ ඊට අයත් භූමිය ද,

"ආදාහනාගාර ක්‍රියාකරු" යන්නෙන්, තත් කාලයේ දී කුරුණෑගල මහා නගර සභාවේ ආදාහනාගාරය සහ එහි කටයුතු භාරව සිටීමට පත්කරනු ලැබ ඇති යම් සේවකයකු ද,

"භෂ්මාවශේෂ" යන්නෙන්, යම් මෘත දේහයක් ආදාහනය කිරීමෙන් අනතුරුව, මෘත දේහයේ සහ එය තැන්පත් කර තිබූ යම් පෙට්ටියක නොදැවී ශේෂ වන යම් ද්‍රව්‍යයන්ද,

"මෘත ශරීරය" යන්නෙන්, මියගිය කිසියම් තැනැත්තකුගේ සම්පූර්ණ මෘත දේහය හෝ අජීවී දරු උපතක මෘත දේහය හෝ යම් මෘත දේහයකින් කිසියම් කොටසක් ද,

අදහස් විය යුතු ය.

"සුසාන භූමි භාරකරු" යන්නෙන්, තත් කාලයේ කුරුණෑගල මහා නගර සභාවේ පොදු සුසාන භූමිය හා එහි කටයුතු බාරව සිටීමට පත්කිරීම් ලබා ඇති සේවකයෙකු අදහස් විය යුතු ය.

*උපලේඛනය*

*පළමුවැනි උපලේඛනය*

*9 වැනි අතුරු ව්‍යවස්ථාව*

ආදාහනාගාරය පාවිච්චි කිරීමේ දී අයකරන ගාස්තු

| | | | |
|---|---|---|---|
| 01. | බල ප්‍රදේශය තුළ පදිංචි වැඩිහිටි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | - | ........... |
| 02. | බල ප්‍රදේශය තුළ පදිංචි වැඩිහිටි අයෙකු නොවන අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | - | ........... |
| 03. | බල ප්‍රදේශයෙන් පිටත පදිංචි වැඩිහිටි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | - | ........... |
| 04. | බල ප්‍රදේශයෙන් පිටත පදිංචි වැඩිහිටි අයෙකු නොවන අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | - | ........... |
| 05. | බල ප්‍රදේශය තුළ පදිංචි සමෘද්ධිලාභියෙකුගේ පවුලේ වැඩිහිටි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | - | ........... |
| 06. | බල ප්‍රදේශය තුළ පදිංචි සමෘද්ධිලාභියෙකුගේ පවුලේ වැඩිහිටි අයෙකු නොවන අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | - | ........... |

මෙහි වැඩිහිටි අයෙකු නොවන අයෙකු යන්නෙන්, වයස අවුරුදු 12 ට අඩු ළමයෙකු අදහස් වේ.

*දෙවැනි උපලේඛනය*

*4 වැනි අතුරු ව්‍යවස්ථාව*

(පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතු ය.) (ඉදිරි පිටුව)

**කුරුණෑගල නගර සභාවේ ආදාහනාගාරයේ මෘත ශරීරයක් ආදාහනය කිරීමට අවසර පත්‍රයක් ලබාගැනීමට ඉල්ලුම් කිරීම**

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙහි දක්වා ඇති තොරතුරුවල සම්පූර්ණ වගකීම මා විසින් භාරගනු ලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි. අදාළ සහතික අමුණා ඇත.

..................................................................................,

අයදුම්කරුගේ අත්සන.

දිනය : 20........................................................

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :......................................................................................................................................
ලිපිනය :.............................................................................................................................................
ජාතික හැඳුනුම්පත් අංකය :..................................................................................................................................
ග්‍රාම නිලධාරී කොට්ඨාස අංකය හා නම :...............................................................................................................................
02. මියගිය අයගේ සම්පූර්ණ නම :....................................................................................................................................
ස්ත්‍රී/පුරුෂ භාවය :.........................................................................................................................
පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය :................................................................................................................................
ග්‍රාම නිලධාරී කොට්ඨාස අංකය හා නම :...............................................................................................................................
03. ජාතික හැඳුනුම්පත් අංකය :...................................................................................................................................
මියගිය තැනැත්තාට ඉල්ලුම්කරුගේ ඇති සම්බන්ධය :...........................................................................................................
(තහවුරු කිරීමට 5 වන අතුරු ව්‍යවස්ථාවේ *(අ)* ඡේදයේ සඳහන් සහතිකයක් අමුණන්න.)
04. මරණ සහතිකයේ ලියාපදිංචි අංකය හා දිනය :.........................................................................................................................
(මරණ සහතිකයේ පිටපතක් අමුණන්න)
05. මරණ ලියාපදිංචි කිරීමේ ලේකම්ගේ නම හා කොට්ඨාසය :.............................................................................................................
06. මරණයට හේතුව :.....................................................................................................................................
07. මරණය සම්බන්ධයෙන් මරණ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, (5 වන අතුරු ව්‍යවස්ථාවේ *(ආ)* ඡේදයේ සහතිකය අමුණන්න.)
පරීක්ෂණ නිලධාරියාගේ නම හා තරාතිරම :...............................................................................................................................
පරීක්ෂණය පැවැත් වූ දිනය :...................................................................................................................................
පරීක්ෂණ නිලධාරියාගේ නිගමනය :.......................................................................................................................................
මෘත දේහය ආදාහනය කිරීමට පරීක්ෂණ නිලධාරියා අවසර දී තිබේ ද? :...............................................................................................
08. ආදාහනය කිරීමට ඉල්ලා සිටින දිනය හා වේලාව (කැමැත්තේ අනුපිළිවෙල අනුව) :

| | *දිනය* | *වේලාව* | | *දිනය* | *වේලාව* |
|---|---|---|---|---|---|
| (i) | 20 ............................ | පැය :.................................. | (ii) | 20............................ | පැය :................................ |
| (iii) | 20............................ | පැය : ................................ | (iv) | 20 ............................ | පැය :................................ |

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙහි දක්වා ඇති තොරතුරුවල සම්පූර්ණ වගකීම් මා විසින් භාර ගනු ලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි. අදාළ සහතික අමුණා ඇත.

.................................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ..................................................

(පසු පිට)

*දෙවැනි උපලේඛනය*

.................................................................. මහත්මා/මහත්මිය/මෙනෙවිය

මහත්මයාණෙනි/මහත්මියෙනි/මෙනෙවියෙනි,

**මෘත දේහයක් ආදාහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම**

ඔබ විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති පසු පිටේ දැක්වෙන අයදුම් පත්‍රයට අනුව, අවසර පත්‍රයක් නිකුත් කිරීම පහත දැක්වෙන හේතුමත ප්‍රතික්ෂේප කරන බව කණගාටුවෙන් දන්වනු කැමැත්තෙමි.

(i) ...............................................................................
(ii) ...............................................................................
(iii) ...............................................................................
(iv) ...............................................................................
(v) ...............................................................................

................................................................................,
බලයලත් නිලධාරියාගේ අත්සන,
(නිල මුද්‍රාව තබන්න).

දිනය : 20..........................................................

---

ආදාහනාගාර භාරකරු,
.......................................................... ආදාහනාගාරය.

***මෘත දේහයක් ආදාහනය කිරීමට නිකුත් කරන අවසර පත්‍රය***

(අ) ..................................................................... යන අයගේ මෘත දේහය 20......................... ක් වූ .............................. මස .................................... දින පෙරවරු/පස්වරු................................. ට.................................................. ආදාහනාගාරයේ දී ආදාහනය කිරීමට මෙයින් අවසර දෙමි.

(ආ) පසුපිට අයදුම්පත්‍රයේ දැක්වෙන තොරතුරු 6 වැනි අතුරු ව්‍යවස්ථාවේ පරිදි ලේඛනයේ සටහන් කරන ලදී.

(ඇ) 20.................................................................... දින, අංක.......................................................... දරන ලදුපත මගින් රු........................ ක් අයකර ගෙන ඇත.

(ඈ) මේ අවසර පත්‍රයේ දැක්වෙන තොරතුරු ආශ්‍රයෙන් II වැනි අතුරු ව්‍යවස්ථාවේ පරිදි අදාළ ලේඛනයේ සටහන් තැබීමෙන් අනතුරුව මෘත දේහය ආදාහනය කිරීමට ක්‍රියා කරන්න.

(ඉ) අවසරපත් ලේඛනයේ අනුක්‍රමික අංකය............................................................................ වේ.

...................................................................................
සභාපති/බලයලත් නිලධාරියාගේ අත්සන,
(නිල මුද්‍රාව තබන්න.).

දිනය : 20.......................................................

10 වන අතුරු ව්‍යවස්ථාව

*තුන්වන උපලේඛනය*

**මහ නගර සභාවේ ආදාහනාගාරයේ මෘත දේහ ආදාහනය කිරීමට නිකුත් කරන ලද අවසර පත්‍ර ලේඛනය**

| අනු. අංකය | මියගිය අයගේ නම | ජා. හැ. ප. අංකය | ස්ත්‍රී /පුරුෂ භාවය | මියගිය දිනය | මරණ සහතිකයේ ලියාපදිංචි කළ | | ඉල්ලුම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අංකය | දිනය | නම | මරණකරු [illegible] ඇති නෑකම |
| 01. | | | | | | | | |
| 02. | | | | | | | | |

| කරුගේ | | මහෙස්ත්‍රාත් /හදිසි මරණ පරීක්ෂක නියෝගයේ | | අවසර පත් අංකය | ලදුපතේ | | ආදාහනය සඳහා වෙන්කළ | |
|---|---|---|---|---|---|---|---|---|
| ලිපිනය | ජා.හැ.ප. අංකය | යොමු අංකය | දිනය | | අංකය | මුදල රු.ශ. | දිනය | වේලාව |
| | | | | | | | | |
| | | | | | | | | |

**14 වන අතුරු ව්‍යවස්ථාව**

***සිව් වන උපලේඛනය***

*මහ නගර සභාවේ ආදාහනාගාරයේ ආදාහනය කරන ලද මෘත දේහ පිළිබඳ ලේඛනය*

| අනු. අංකය | මියගිය අයගේ නම | ජා.හැ. පත් අංකය | ස්ත්‍රී/පුරුෂ භාවය | අවසරපත් ලේඛනයේ අනු අංකය | මියගිය දිනය | මරණ සහතිකයේ ලියාපදිංචි කළ | | ඉල්ලුම් | කරුගේ | අවසරපත් අංකය | ලදුපතේ | | ආදාහනය කළ | | භෂ්මාවශේෂ ගෙන ගිය දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අංකය | දිනය | නම | ජා.හැ. අංකය | | අංකය | මුදල රු.ශ. | දිනය | වේලාව | |
| 01. | | | | | | | | | | | | | | | |
| 02. | | | | | | | | | | | | | | | |
| 03. | | | | | | | | | | | | | | | |
| 04. | | | | | | | | | | | | | | | |

**සැ. යු. - මෙහි ඉහළ කොටස ලේඛනයේ වම් පසටද පහළ කොටස දකුණු පසටද වනසේ ලේඛනය පිළියෙල කරගත යුතු ය.)**

**06-645/2**

## කුරුණෑගල මහ නගර සභාව

### කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය තුළ වාහන නතර කිරීම හා වාහන හැසිරවීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

252 හා අධිකාරිය වන 1947 අංක 16 දරන නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියේ පළවන උපවගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 272 වන වගන්තියේ (06) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙන් මහා නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව කුරුණෑගල මහ නගර සභාව විසින් සාදනු ලැබූ සහ 2014.09.30 දින පැවති එකී මහා නගර සභාවේ 4(01) දරන යෝජනාවෙන් සභා සම්මත වී ඇති මෙහි පහත උපලේඛනයෙන් දැක්වෙන කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය තුළ වාහන නතර කිරීම හා වාහන හැසිරවීම විධිමත් කිරීම, අධීක්‍ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික) විධිවිධාන පනතේ දෙවන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී මහ නගර සභා ආඥාපනතේ 268 වන වගන්තියේ (1) වන උප වගන්තිය ප්‍රකාරව වයඹ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය දයාසිරි ජයසේකර වන මවිසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නීතිඥ ජේ. පී. දයාසිරි පද්මකුමාර ජයසේකර,
වයඹ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍ය,

2015 ජුනි මස 05 වැනි දින,
වයඹ ප්‍රධාන අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

#### කුරුණෑගල මහ නගර සභාවේ වාහන නතර කිරීම හා වාහන හැසිරවීම විධිමත් කිරීම, අධීක්‍ෂණය හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. මෙම අතුරු ව්‍යවස්ථා කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශයේ මාර්ගවල රථ වාහන නතර කිරීම හා එකී මාර්ගවල රථ වාහන හැසිරවීම විධිමත් කිරීම, අධීක්‍ෂණය හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ. — අතුරු ව්‍යවස්ථාවේ නාමය

2. මහා නගර සභා බල ප්‍රදේශයේ වාහන නතර කිරීම හා වාහන හැසිරවීම විධිමත්ව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාම මගින් මගී ආරක්ෂාව හා රථවාහන අනතුරු වලක්වා ගැනීම උදෙසා — අරමුණ

3. මහ නගර සභා ආඥා පනතේ 267-1 වගන්තිය සමඟ කියවිය යුතු 272-6 ඇ. උපවගන්තිය යටතේ මහ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත. — අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

4. *(අ)* මහ නගර සභා බල ප්‍රදේශයේ කිසියම් වීථියක හෝ මාර්ගයක කවර වූ හෝ කොටසක - — ඉටුකළ යුතු කාර්යයන්

(i) රථවාහන නවතා තැබීම තහනම් කිරීම;
(ii) සීමා කිරීම;
(iii) එක් පැත්තක පමණක් වාහන නවතා තැබීමට ඉඩ දීම;
(iv) බඩු බෑම හෝ පැටවීම තහනම් කිරීම හෝ සීමා කිරීම;
(v) මගීන් බැස්සවීම හෝ නැග්ගවීම තහනම් කිරීම;
(vi) බස් නැවතුම් ස්ථාන නම් කිරීම;
(vii) තනි අතට පමණක් වාහන ධාවනය කරන වීථි හෝ මාර්ග නම් කර ගමන් කළ හැකි දිශාව තීරණය කිරීම.

සඳහා මහ නගර සභාවට බලය තිබිය යුතු ය.

*(ආ)* මහ නගර සභාව විසින් *(අ)* ඡේදය යටතේ වන කිසියම් සීමා කිරීමක් කරනු ලැබීමෙන් අනතුරුව එකී සීමා කිරීම පිළිබඳ මාර්ග සංඥා අදාළ ස්ථානයේ සවිකිරීමට සැලැස්වීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය. එකී සීමා කිරීම් පිළිබඳ මාර්ග සංඥා, මෝටර් වාහන පනතේ 164 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1987 මාර්තු මස 13 වන දිනැති අංක 444/18 දරන 1 වන කොටස (1) වන ඡේදය *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති නියෝගවලට අනුව විය යුතුවාත් හැර එකී නියෝගවලට කලින් කල කරනු ලබන සංශෝධනයන්ට යටත් විය යුතු ය.

5. මහා නගර සභා ප්‍රදේශය ඇතුළත හෝ මහා නගර සභා ප්‍රදේශය හරහා වැටී ඇති කිසියම් වීථියක හෝ මාර්ගයක ධාවනය කරන ඕනෑම වාහනයක රියැදුරෙකු විසින් 1 වන අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ නියමයන් යටතේ සවිකරනු ලැබ ඇති මාර්ග සංඥාවකින් හෝ සංඥාවලින් නිරූපණය කෙරෙන නියමයන් පිළිපැදීම කරනු ලැබිය යුතු ය.

6. සෑම රථ ගාලක ම නවතා තැබීමට පැමිණෙන වාහන ඇතුල් කිරීමේ දොරටුව හා පිටවීමේ දොරටුව පහසුවෙන් කියවීමට හැකිවන ආකාරයෙන් භාෂාත්‍රයෙන් දැන්වීමක් සවිකර තිබිය යුතු අතර එකී ස්ථානය ඇතුළත වාහන නවතා තැබීමට පැමිණීමේ දී සහ ඉන් පිටතට ගැනීමේ දී ධාවනය කළ යුතු දිශාව පහසුවෙන් හඳුනාගැනීමට හැකිවන ආකාරයෙන් සෙන්ටි මීටර් 20ක පළලින් යුතු සුදු පාට රේඛාවක් සහිත ඊතල සලකුණු කර තිබිය යුතු ය.

7. සෑම රථ ගාලකම බිම තාර දමා හෝ කොන්ක්‍රීට් දමා තිබිය යුතු අතර එකී රථ ගාල පරිහරණය කරන්නන්ගේ පාවිච්චිය සඳහා ස්ත්‍රී හා පුරුෂ දෙපාර්ශවයට වෙන් වෙන් වූ වැසිකිළි තනා තිබිය යුතුය. එසේම ස්ථානය තුළ රැස්වන ජලය පහසුවෙන් ගලා යාමට ප්‍රමාණවත් කාණු තනා තිබිය යුතු ය.

8. සෑම රථ ගාලකම පරිශ්‍රය තුළ එකතුවන කසළ දිනපතා බැහැර කිරීමට සහ එකී ස්ථානයේ පවත්නා වැසිකිළි දිනපතා විෂබීජ නාශක යොදා පිරිසිදු කිරීමටත් සැලැස්වීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

9. සෑම රථගාලක ම වාහන නවතා තැබීමට ඉඩකඩ වෙන් කිරීමේ දී රථ ගාල ඇතුළට පැමිණෙන සහ ඉන් පිටවන වාහනවලට ගමන් කිරීම සඳහා ප්‍රමාණවත් ධාවන මං තීරු ඇතිකර තිබිය යුතු ය.

10. කිසියම් වාහනයක් රථ ගාල ඇතුළත ධාවනය කිරීමේ දී හා ගාල් කිරීමේ දී , ඒ තුළ ගාල් කර ඇති වෙනත් යම් වාහනයකට බාධාවක් නොවන පරිදි එක් එක් වාහනය නවතා තැබීමට රථ ගාල ඇතුළත ප්‍රමාණවත් ඉඩ කඩ වෙන් කර තිබිය යුතු අතර එක් එක් වාහනය සඳහා වෙන් කර ඇති සීමාව පෙන්නුම් කෙරෙන සෙන්ටි මීටර් 10ක පළලින් යුතු සුදුපාට රේඛාවකින් සලකුණු කර තිබිය යුතු ය.

11. කිසියම් රථ ගාලක් ඇතුළත වාහන නවතා තැබීම වෙනුවෙන් මහ නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයේ ගාස්තුවක් අය කළ හැකි ය. එසේම කිසියම් රථ ගාලක නවතා තබන යම් වර්ගයක වාහනයක් නවතා තැබීම වෙනුවෙන් අයකිරීමට මහ නගර සභාව තීරණය කළ ගාස්තු ප්‍රමාණය එකී රථ ගාලේ ඇතුළ්වීමේ දොරටුවේ ප්‍රකටව පෙනෙන පරිදි භාෂාත්‍රයෙන් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

12. *(අ)* කිසියම් රථ ගාලක නවතා තබන වාහනවලින් ගාස්තු අයකිරීම සඳහා මෙහි මින් මතු “රථ ගාල භාරකරු” යනුවෙන් හඳුන්වනු ලබන —

(i) මහා නගර සභාවේ සේවයේ නියුක්ත කවර හෝ සේවකයෙකු ; හෝ

(ii) මහ නගර සභාව විසින් ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම මගින් තෝරා ගනු ලැබූ කිසියම් සාර්ථක ටෙන්ඩර්කරුවෙකු හෝ එකී ටෙන්ඩර්කරු විසින් නම් කරනු ලැබූ ඔහුගේ අනුයෝජිතයෙකු ;

යෙදවීම කළ හැකි ය.

*(ආ)* එසේ වුව ද, කිසියම් රථ ගාලක වාහන නවතා තැබීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තුව 11 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට මහා නගර සභාව විසින් තීරණය කරනු ලැබූ ගාස්තුවේ ප්‍රමාණය නොඉක්මවිය යුතුවාක් හැර එක් එක් වාහනය නවතා තැබීම වෙනුවෙන් අයකළ ගාස්තු ප්‍රමාණය මේ කොටසේ පළමුවන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරගත් කුවිතාන්සියක සටහන් කර වාහනයේ රියදුරා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

13. සෑම රථ ගාල භාරකරුවෙකු ම ඒ කාර්යයේ නියුක්ත වන කාලය ඇතුළත මහා නගර සභාව විසින් තීරණය කරනු ලබන හා රථ ගාල භාරකරු පහසුවෙන් හඳුනා ගැනීමට හැකිවන ආකාරයේ ඇඳුමකින් සැරසී සිටීමට සැලැස්වීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

14. *(අ)* අතුරු ව්‍යවස්ථා 12 හි (ආ) ඡේදය යටතේ නවතා තැබීමට ඉඩදෙනු ලැබීමට තීරණය කර ඇති කිසියම් වර්ගයක රථයක් නවතා තැබීමට රථ ගාලට ඇතුල් කරන අවස්ථාවේ දී එකී රථ ගාලේ ඇතුල්වීමේ දොරටුව ළඟ දී එකී වාහනයේ රියැදුරා වෙත මේ කොටසේ දෙවන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ ඇතුල්වීමේ අවසරය දක්වෙන ඇතුල්වීමේ අවසර කාඩ් පත්‍රයක් නිකුත් කිරීම රථ ගාල භාරකරුගේ කාර්යය විය යුතු ය.

*(ආ)* ඇතුල්වීමේ අවසර පත්‍රයක් සහිත සෑම වාහනයක් ම රථ ගාලෙන් පිටත්ව යාමට පෙර -

(i) (අ) ඡේදයේ සඳහන් කාඩ් පත්‍රය රථ ගාල භාරකරුට ආපසු භාරදීම;

(ii) අතුරු ව්‍යවස්ථා 11 හි සඳහන් ආකාරයට මහ නගර සභාව විසින් තීරණය කරනු ලැබූ ප්‍රමාණයන්ට ගැලපෙන වාහන නවතා තැබීමේ ගාස්තුව රථ ගාල භාරකරුට ගෙවීම ; සහ

(iii) ගෙවන ලද ගාස්තුවට ගැලපෙන 12 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ සඳහන් කුවිතාන්සියක් ලබා ගැනීම ;

එකී වාහනයේ රියැදුරාගේ කාර්යය විය යුතු ය.

15. නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ රථ ගාල භාරකරු හෝ යම් පොලිස් නිලධාරියෙකු විසින් කිසියම් රථ ගාලක නවතා තිබෙන යම් වාහනයක අයිතිකරුගෙන් නැතහොත් රියදුරුගෙන් වාහනය සඳහා නිකුත් කළ ඇතුල්වීමේ අවසර කාඩ් පත පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටි අවස්ථාවක එය පරීක්ෂා කිරීම සඳහා ලබා දීම එකී වාහනයේ අයිතිකරුගේ හෝ රියදුරුගේ කාර්යය විය යුතු ය.

16. මහා නගර සභා ප්‍රදේශය ඇතුළත පිහිටුවා තිබෙන යම් රථ ගාලක් ඇතුළත නවතා තබන -

*(අ)* රජයේ වාහනවලට,
*(ආ)* පළාත් සභාවේ වාහනවලට,
*(ඇ)* පළාත තුළ සංස්ථාපනය කර ඇති කිසියම් පළාත් පාලන ආයතනයක වාහනවලට,

මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ නොවිය යුතු ය. එසේ වුව ද කිසියම් රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක යම් වාහනයකට එකී විධිවිධාන මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල සඳහන් ආකාරයෙන්ම අදාළ විය යුතුය.

17. කිසියම් රථ ගාලක ඇතුල්වීමේ අවසර කාඩ් පත්‍රයක් නොමැතිව නවතා තබා ඇති කිසියම් වාහනයක් එකී රථ ගාලෙන් ඉවත් කිරීමට නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ රථ ගාල භාරකරු හෝ ක්‍රියා කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

18. *අතුරු ව්‍යවස්ථා* 5 හි කුමක් සඳහන්ව තිබුණද 4 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ මහා නගර සභාව විසින් තීරණය කරනු ලැබ සවිකරනු ලැබූ කිසියම් මාර්ග සංඥාවක් මගින් නියම කරනු ලැබ ඇති සීමාවන් - නොකළ යුතු කාර්යයන්

*(අ)* එකී වීථියේ හෝ මාර්ගයේ කිසියම් කොටසක හෝ මහා නගර සභා ප්‍රදේශය තුළ වෙනත් කවර හෝ වීථියක හෝ මාර්ගයක ආසන්නයේ ඇති කිසියම් ගොඩනැගිල්ලක හෝ ඒ ආසන්නයේ ඇතිවන යම් ගින්නක් හෝ වෙනත් යම් ආපදාවක් මැඩ පැවැත්වීමේ කාර්යය සඳහා යොදා ගන්නා මහා නගර සභාවේ ගිනි නිවන රථයක් හෝ වෙනත් කවර වූ හෝ වාහනයක් සඳහා

(ආ) එකී වීථියේ හෝ මාර්ගයේ කිසියම් කොටසක හෝ මහා නගර සභා ප්‍රදේශය තුළ වෙනත් කවර හෝ වීථියක හෝ මාර්ගයක ඇතිවන වාහන තදබදයක් මඟ හැරවීම සඳහා හෝ මහා නගර සභා ප්‍රදේශය ඇතුළත ඇතිවන වෙනත් කිසියම් අනපේක්ෂිත තත්ත්වයක් පාලනය කිරීම සඳහා යම් පොලිස් නිලධාරියෙකු විසින් අවස්ථාවෝචිත පරිදි කරනු ලබන විධානයක් අනුව ක්‍රියා කිරීම සඳහා

එකී 5 වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කිරීමක් ලෙස සැලකීම නොකළ යුතු ය.

19. *(අ)* කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් රථ ගාලක නවතා තැබීමට ඉඩ දීමට නගර සභාව තීරණය කර ඇති වර්ගයක වාහනයක් වන්නේ නම් මිස වෙනත් කවර වූ වාහනයක් හෝ මෝටර් වාහනයක් නොවන කවර වූ වාහනයක් රථ ගාලක නවතා තැබීම හෝ රථ ගාලකට ඇතුල් කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ කරනු නොලැබිය යුතු ය.

*(ආ)* රථ ගාලක නවතා තිබෙන කිසියම් වාහනයක් එකී රථ ගාලෙන් ඉවතට ගැනීම සඳහා එකී වාහනය පන ගැන්වීමට නොහැකි වන අවස්ථාවක දී, එකී වාහනය ඇදගෙන යාම සඳහා රථ ගාල තුළට පැමිණෙන කිසියම් වෙනත් යම් වාහනයක් එකී රථ ගාලට ඇතුල්කිරීමට ප්‍රමාණවත් ඉඩකඩක් ඇත්තේ නම් එසේ පැමිණෙන වෙනත් වාහනයකට (අ) ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය. එසේ වුව ද එකී වාහනය ඇදගෙන යාමේ දී රථ ගාලේ නවතා තිබෙන වෙනත් වාහනවලට කවර හෝ බාධාවක් හෝ හානියක් වන ආකාරයෙන් ඇදගෙන යාම නොකළ යුතු ය.

20. කවර තැනැත්තෙකු විසින් කිසියම් රථ ගාලක ඇතුළත -

*(අ)* වාහන සේදීම හෝ එසේ කිරීමට සැලැස්වීම;
*(ආ)* යම් වාහනයක් ඉවත් කර ගැනීමේ කාර්යය සඳහා එකී වාහනය පන ගැන්වීමට අත්‍යවශ්‍ය අලුත්වැඩියාවක් හෝ රෝදයක් මාරු කිරීමේ කාර්යයක් හෝ නොවන වෙනත් කවර හෝ අලුත්වැඩියාවක් කිරීම;
*(ඇ)* (ආ) ඡේදයේ සඳහන් කිසියම් අලුත්වැඩියා කිරීමකදී අවස්ථාවෝචිත කරුණු පිළිබඳ සැලකිල්ලට ගැනීමේ දී හැර අනවශ්‍ය වන්නාවූ හෝ බාධාකාරී වන්නාවූ හෝ කිසියම් ශබ්දයක් හෝ ශබ්ද ඇති කිරීම;
*(ඈ)* එකී රථගාල භාරකරුගේ අවසරයක් නොමැතිව වාහනය නවතා ඇති ස්ථානයක සිට එම රථ ගාලේම වෙනත් ස්ථානයකට ගෙන ගොස් නැවතීම;

(ඉ) එකී රථ ගාලේ ධාවන මං තීරු හෝ ඇතුල්වීමේ හා පිටවීමේ දොරටු අවහිර වන සේ වාහන නවතා තැබීම;
(ඊ) අනතුරක් වැළැක්වීම හෝ වාහනයේ හෝ එහි රැඳී සිටින්නන්ගේ ආරක්‍ෂාව තහවුරු කිරීමේ හෝ කාර්යය සඳහා හැර යම් වාහනයක සවිකර ඇති අනතුරු ඇඟවීමේ උපකරණ නාද කිරීම;
(උ) ගාල් කර ඇති හෝ එකී රථ ගාලට ඇතුල්වන හෝ ඉන් පිටවන කිසියම් වාහනයක නලාව හැඬවීම;
(ඌ) මත්පැන් පානය කිරීම හෝ බුලත් කෙළ ගැසීම හෝ අසභ්‍ය වචන පාවිච්චි කිරීම හෝ කළ කෝලාහල කිරීම හෝ සදාචාරාත්මක නොවන ක්‍රියාවක යෙදීම ; හෝ

නොකළ යුතු ය.

21. කිසියම් රථ ගාලක නවතා තබන කවර හෝ වාහනයක ආරක්ෂාව පිළිබඳ වගකීම එකී වාහනය රථ ගාල තුළ නවතා තබන තැනැත්තා වෙත තිබිය යුතුවාක් හැර යම් වාහනයකට රථ ගාල ඇතුළත දී සිදුවන කිසියම් අලාභයක් හෝ හානියක් හෝ සම්බන්ධයෙන් මහා නගර සභාව හෝ නාගරික කොමසාරිස්වරයා හෝ රථ ගාල භාරකරු හෝ වගකීමට යටත් නොවිය යුතු ය.

21. අතුරු ව්‍යවස්ථා 6 හි සඳහන් ආකාරයෙන් කිසියම් රථ ගාලක් ඇතුළත පිහිටි ධාවන මං තීරුවක වාහන ධාවනය කළ යුතු දිසාව පෙන්වන සලකුණු කර ඇති දිසාවට පටහැනි දිසාවට කවර හෝ අවස්ථාවක කිසියම් වාහනයක් ධාවනය කිරීම නොකළ යුතු ය.

23. කිසියම් රථ ගාලක කර ඇති යම් ඉදිකිරීමකට හෝ ඒ තුළ පවත්නා යම් උපකරණයකට හෝ හානි කිරීම හෝ විකෘති කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

අභිමතය/ අත්හැරීම්/නිදහස් කිරීම්

24. (අ) මහා නගර සභා ප්‍රදේශය තුළ, මෙහි මින් මතු "රථ ගාල" යනුවෙන් හඳුන්වනු ලබන මෝටර් වාහන නවතා තැබීමේ කාර්යය සඳහා -
(i) මහා නගර සභාව සතු කිසියම් ඉඩමක් ; හෝ
(ii) වෙනත් කිසියම් අධිකාරයක් සමග ඇතිකර ගනු ලබන ගිවිසුමක් අනුව එකී අධිකාරය සතු කිසියම් ඉඩමක්; හෝ
වෙන් කිරීමට මහා නගර සභාවට බලය තිබිය යුතු ය.

(ආ) කිසියම් රථ ගාලක නවතා තැබිය හැකි වාහන වර්ගය සහ එකවර නවතා තැබිය හැකි වාහන වර්ගය සහ එකවර නවතා තැබිය හැකි උපරිම වාහන සංඛ්‍යාව කොපමණද යන්න කලින් කල තීරණය කිරීම මහා නගර සභාව විසින් කරනු ලැබිය හැකි ය.

25. සෑම රථ ගාලකම අවම වශයෙන් වාහන ඇතුල්කිරීම සඳහා එක් දොරටුවක් සහ පිටවීම සඳහා එක් දොරටුවක් ද බැගින් දොරටු දෙකක් වෙන් කර තිබිය යුතු ය. එසේ වුව ද රථ ගාල ඇතුළත වාහන හැරවීම සඳහා ම වෙන් වූ කොටසක් ඇති කර තිබෙන්නේ නම් හා එකවර වාහන දෙකක් දෙපසට ගමන් කළහැකි ද්විත්ව ධාවන මං තීරු හා දොරටුවේ ඉඩකඩ සලස්වා ඇති අවස්ථාවක වාහන ඇතුල්වීම සහ පිටවීම සඳහා එක් දොරටුවක් පමණක් තිබීමට සැළැස්විය හැකි ය.

බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය

26. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතු ය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

27. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේ ය.

දඩ හා දණ්ඩන

28. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඇතුළත් වූ කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම පිළිබඳව වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ 267 වන වගන්තියෙහි (3) උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටක ඉහත එකී 267 වගන්තියෙහි (3) වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට යටත් විය යුතු ය.

අර්ථ නිරූපනය හා නිර්වචන

29. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

"මාර්ගය" යන්නෙන්, නගර සභාව සතු කිසියම් මංමාවතක්, මාර්ගයක්, මහා මාර්ගයක්, පටුමගක්, වීථියක්, දෙවැටක්, පඩි පෙළක් ඒදණ්ඩක් හෝ මගී පාලමක් අදහස් වන අතර නගර සභාව සතු කිසියම් මංමාවතකට, මාර්ගයකට, මහා මාර්ගයකට, පටුමගකට, වීථියකට, දෙවැටකට, පඩි පෙළකට සම්බන්ධව සවිකර හෝ සිටුවා ඇති කිසියම් දුර පෙන්වන සලකුණක්, මායිම් ගලක්, මායිම් කණුවක්, පහන් කණුවක්, පාලමක්, කවර හෝ ආකාරයක බෝක්කුවක්, දිය පැන්නුමක්, තාප්පයක්, ආරුක්කුවක්, වේල්ලක්, කාණුවක්, සොරොව්වක්, ආධාරක බැම්මක්, අත්වැලක්, දම්වැලක්, වැටක්, සංඥා පුවරුවක්, මාර්ග නාම පුවරුවක් හෝ මාර්ගයට යාබද පදික වේදිකාවක් ද ඊට ඇතුළත් විය යුතු ය.

"වාහනය" යන්නෙන්, මෝටර් වාහන පනතේ කිසියම් මෝටර් වාහනයක් සඳහා දෙන ලද අර්ථ නිරූපණයට ගැලපෙන කිසියම් මෝටර් වාහනයක් අදහස් විය යුතු ය.

"නගරාධිපතිවරයා " සහ "නියෝජ්‍ය නගරාධිපතිවරයා යන යෙදුම් වලින් පිළිවෙලින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තෝරාපත් කර ගන්නා ලද නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා අදහස්වේ.

"මහ නගර සභාව" යන්නෙන්, කුරුණෑගල මහ නගර සභාව ද අදහස් වන්නේ ය.

"කොමසාරිස්වරයා" යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වන අතර ඒ සභාවේ යම් නියෝජ්‍ය හෝ සහකාර නාගරික කොමසාරිස්වරයෙක් සහ නාගරික කොමසාරිස්වරයා හෝ නියෝජ්‍ය හෝ සහකාර නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙක් ද කොමසාරිස්වරයාගේ බලතල කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥාපනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ . ඒ සභාවේ යම් නිලධාරියෙක් ද ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණයට ඊට ඇතුළත්වේ.

*උපලේඛන*

*පළමුවන උපලේඛනය*

*12 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදය*

*...................................................... [2] සභාව*
*............................................. රථ ගාල*

*වාහන නවතා තැබීමේ ගාස්තු*
*ලදුපත් අංකය.................................................*

---

| | | |
|---|---|---|
| වාහනයේ අංකය | : | .............................................................................. |
| දිනය | : | 20 ........................................................................ |
| පැමිණි වේලාව | : | පෙ.ව./ප.ව. : .................................................... |
| පිටවූ වේලාව | : | පෙ.ව. /ප.ව : ................................................ |
| අයකළ ගාස්තුව | : | රුපියල් .............................................................. |

*දෙවැනි උපලේඛනය*

*14 වැනි අතුරු ව්‍යවස්ථාවේ (අ) ඡේදය*

කාඩ් පත්‍රයේ ඉදිරිපස

**......................................................... [2] සභාව**

**.................................................................... රථ ගාල**

**ඇතුල්වීමේ අවසර කාඩ් පත්‍රය**

කාඩ් පත්‍රයේ පිටුපස

**මෙම කාඩ් පත්‍රය අන්සතු නොකළ යුතු ය.**

**රථ ගාලෙන් පිටවන අවස්ථාවේ දී ආපසු භාරදිය යුතු ය.**

06-645/3

**කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

252 හා අධිකාරිය වන 1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 267 වන වගන්තියේ පළවන උපවගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 272 වන වගන්තියේ (06) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙන් මහා නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව කුරුණෑගල මහා නගර සභාව විසින් සාදනු ලැබූ සහ 2014.09.30 පැවති එකී මහා නගර සභාවේ 4(01) දරන යෝජනාවෙන් සභා සම්මත වී ඇති මෙහි පහත උපලේඛනයෙන් දැක්වෙන කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික) විධිවිධාන පනතේ දෙවන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී මහා නගර සභා ආඥාපනතේ 268 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය දයාසිරි ජයසේකර වන මවිසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නීතිඥ ජේ. පී. දයාසිරි පද්මකුමාර ජයසේකර,
වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍ය,

2015 ජුනි මස 05 වැනි දින,
වයඹ ප්‍රධාන අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

උපලේඛනය

**කුරුණෑගල මහා නගර බල ප්‍රදේශය තුල ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

අතුරු ව්‍යවස්ථාවේ නාමය.

1. කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශයේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

අරමුණ.

2. කුරුණෑගල මහා නගර සභා ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කෙරෙන සියලුම ප්‍රචාරක දැන්වීම් මහජනයාට හා පරිසරයට හිතකර අන්දමින් නීති රීතිවලට අනුකූලව විධිමත්ව නියාමනය කිරීම හා පාලනය කිරීම අරමුණ වේ.

අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන.

3. මහා නගර සභා ආඥා පනතේ 267(1) වගන්තිය සමග කියවිය යුතු 272(6) ඇ උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත.

ඉටුකළ යුතු කාර්යයන්.

4. මහා නගර සභා ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩදෙනු ලබන ප්‍රදේශ කවරේද යන්න මහ නගර සභාව විසින් කලින් කළ තීරණය කරනු ලැබිය හැකි ය. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩදෙනු ලබන ප්‍රදේශ පිළිබඳව කලින් කළ මහ නගර සභාව විසින් ගනු ලබන තීරණය පිළිබඳ නිවේදනයක් *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කිරීමට සැලැස්වීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය වන අතර, එකී නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින හෝ එහි නිශ්චිතව දැක්වෙන යම් ඉදිරි දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

5. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති කාලසීමාව සඳහා පමණක් වලංගු විය යුතු ය.

6. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍රයක් අවශ්‍ය කරන සෑම තැනැත්තෙකුම විසින්, අවම වශයෙන් එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට වැඩ කරන දින 2කට පෙර මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කර ගත් අයදුම්පත්‍රයක් නාගරික කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

   *(අ)* බලපත්‍රයක් ලබාගැනීමට ඉදිරිපත් කරන සෑම ඉල්ලුම්පත්‍රයක් ම සමග මිලි මීටර් 210 xමිලි මීටර් 297 ප්‍රමාණයේ කඩදාසියක, 1:1000 පරිමාණයට අනුව පිළියෙල කළ දැන්වීමේ ආදර්ශයක් සහ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන ස්ථානයේ හෝ ස්ථානවල මිලි මීටර් 210 xමිලි මීටර් 297 ප්‍රමාණයේ කඩදාසියක 1:1000 පරිමාණයට අඳින ලද භූමි සැලැස්මක් /සැලසුම් ඉදිරිපත් කර තිබිය යුතු අතර ප්‍රචාරක දැන්වීමේ නියම දිග හා පළල එහි සටහන් කර තිබිය යුතු ය.

7. ඉදිරිපත් කරනු ලැබ ඇති කිසියම් ඉල්ලුම් පත්‍රයක් වෙනුවෙන් මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමට අවශ්‍ය නියමයන් සම්පූර්ණ කර ඇති විටක ඒ බව නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඉල්ලුම්කරුට දැන්විය යුතු ය. ඉල්ලුම්කරුට එකී දැන්වීම ලැබීමෙන් අනතුරුව ඔහු විසින් 22 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ බලපත්‍ර ගාස්තුව සහ 17(අ) වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ඇප මුදල මහා නගර සභාව වෙත ගෙවනු ලැබීමෙන් පසුව අදාළ බලපත්‍රය නිකුත් කිරීම නාගරික කොමසාරිස්වරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය විය යුතු ය.

   *(අ)* මෙම අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණද කිසියම් ආගමික කාර්යයක් හෝ මුදල් අයකිරීමකින් තොරව පවත්වනු ලබන යම් සංස්කෘතික කාර්යයක් සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක් බලපත්‍ර ගාස්තුවෙන් නිදහස් විය යුතු ය. එසේ වුව ද එවැනි ප්‍රචාරක දැන්වීමක් සඳහා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල අනෙකුත් විධිවිධන ඒ ආකාරයෙන්ම අදාළ විය යුතු ය.

8. ප්‍රදර්ශනය කරනු ලබන සෑම දැන්වීමක් සඳහා නිකුත් කළ බලපත්‍රයේ අංකය ඒ දැන්වීම හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට පෙර එක් එක් දැන්වීමේ දකුණු පස පහළ කෙළවරේ සටහන් කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

9. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට ඉදිරිපත් කළ ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරන ලද ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කරනු ලබන අවසාන දිනයෙන් පසුව පැය හතලිස් අටක් ගත වීමට මත්තෙන් එකී ප්‍රචාරක දැන්වීම හා ඊට යොදාගත් වෙනත් සියලුම ද්‍රව්‍ය කොටස් ඒ ස්ථානයෙන් හෝ ස්ථානවලින් ඉවත් කරවීමට සැලැස්වීම එකී බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

10. කිසියම් ව්‍යාපාරික ස්ථානයක නාමය, අංකය සහ/හෝ ලිපිනය සමග වෙනත් කිසියම් වෙළඳ භාණ්ඩයක් හෝ සේවාවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරනු ලැබ ඇති අවස්ථාවක සහ කිසියම් නිවාසයක කවර හෝ ආකාරයේ වෙළඳ භාණ්ඩයක හෝ සේවාවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කර ඇති අවස්ථාවක, ඒ ප්‍රචාරක දැන්වීම හෝ ප්‍රචාරක දැන්වීම් මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට යටත් විය යුතු ය. මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන සම්බන්ධයෙන් බලපත්‍ර ලබාගත යුතු තැනැත්තා ලෙස එකී ව්‍යාපාරික ස්ථානයේ හෝ නිවාසයේ හිමිකරු, කළමනාකරු හෝ ඒ අවස්ථාවේ එහි පාලනය භාරව සිටින කවර හෝ තැනැත්තෙකු අදහස් විය යුතු ය.

11. *(අ)* නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා මෙහි පළමුවන උපලේඛනයේ දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කර නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභා ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූ විට පෙනෙන පරිදි කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය. නොකළ යුතු කාර්යයන්.

*(ආ)* ප්‍රදර්ශනය කිරීම සඳහා වලංගු බලපත්‍රයක් ලබා ඇත්තේ වුව ද කවර හෝ ප්‍රචාරක දැන්වීමක්, ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූ විට පෙනෙන පරිදි අදාළ බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති ස්ථානයක හෝ ස්ථානවල හැර වෙනත් කවර හෝ ස්ථානයක ප්‍රදර්ශනය කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

12. මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම ඉල්ලුම්කරු විසින් සම්පූර්ණ කර ඇත්තේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

*(අ)* මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලැබූ කලාපයක් තුළට අයත් ස්ථානයක ප්‍රදර්ශනය කිරීමට වන ඉල්ලීමක් විය යුතු ය,

*(ආ)* දැන්වීම ප්‍රදර්ශනය කිරීමට ඉල්ලා සිටින ස්ථානය සඳහා වෙනත් තැනැත්තෙකුට කලින් නිකුත් කළ බලපත්‍රයක වලංගු කාල සීමාව අවසන් වී තිබිය යුතු ය. එසේ වුව ද කලින් නිකුත් කළ හා තවදුරටත් වලංගු බලපත්‍රයක් යටතේ ප්‍රදර්ශනය කරනු ලබන කිසියම් දැන්වීම් පුවරුවක සඳහන් දැන්වීම් දර්ශනය වීමට බාධාවක් නොවන පරිදි ඊට ආසන්නයේ දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට බලපත්‍රයක් නිකුත් කිරීමට මේ විධිවිධාන බාධාවක් නොවිය යුතු ය,

*(ඇ)* ප්‍රදර්ශන බලපත්‍රය ඉල්ලා සිටින දැන්වීම අසභ්‍ය හෝ පිළිකුල් සහගත හෝ සදාචාර සම්පන්න නොවන හෝ කිසියම් සංස්කෘතියකට හානිකර හෝ කවර හෝ ආගමකට හෝ ජන වර්ගයකට හෝ ජන කොට්ඨාසයකට හානිවන හෝ එවැනි තත්ත්වයක් ඇති වීමට ඉඩ තිබෙන හෝ ආකාරයේ දර්ශන හෝ වදන් හෝ ඇතුළත් වන ආකාරයේ දැන්වීමක් නොවිය යුතු ය,

*(ඈ)* මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නගර සභාව විසින් ඉදි කරනු ලැබ ඇති දැකුම් පැළැල්ලක ප්‍රදර්ශනය කිරීමට බලපත්‍රයක් ඉල්ලා ඇති අවස්ථාවක එකී දැකුම් පැළැල්ලේ ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් තිබිය යුතුවාත් හැර ඒ අවස්ථාව වන විටත් කලින් නිකුත් කළ කිසියම් බලපත්‍රයක් යටතේ ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් සඳහා වෙන්කළ කාලය ඉකුත් වී තිබිය යුතු ය.

*(ඉ)* කවර හෝ ලිඛිත නීතියකින් තහනම් කර හෝ සීමා කර ඇති ආකාරයේ ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රදර්ශනය කිරීමක් නොවිය යුතු ය.

13. ප්‍රචාරක දැන්වීම අසලින් ගමන් ගන්නා කවර හෝ තැනැත්තෙකුට හෝ වාහනයකට හෝ අවහිර වීමක් හෝ අනතුරක් සිදුවන ආකාරයෙන් කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවි නොකළ යුතු ය. එසේම වාහන පදවාගෙන යනු ලබන කිසියම් රියැදුරෙකුගේ අවධානය වෙනස් කරන ආකාරයෙන් හෝ ඔහුගේ දර්ශනයට අවහිර වන ආකාරයෙන් විදුලි ආලෝක ධාරා සවිකිරීම හෝ ප්‍රතිදීප්ත කිරීම නොකර ඇති බවට රථවාහන පොලිස් ස්ථානාධිපතිගේ වාර්තාවක් ලබාගෙන මිස ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය.

14. ප්‍රදර්ශනය සඳහා වලංගු බලපත්‍රයක් ලබාගෙන ප්‍රදර්ශනය කරන කවර හෝ දැන්වීමකට සිදුවන යම් හානියක් හෝ විකෘති කිරීමක් හෝ ඉවත් කිරීමක් සම්බන්ධයෙන් මහා නගර සභාව කවර ආකාරයක හෝ වගකීමකට යටත් නොවිය යුතු ය.

15. කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් පොදු ස්ථානයක තිබෙන හෝ එවැනි ස්ථානයකට යාබදව තිබෙන ගසක, ගසක කඳක, අත්තක හෝ වෙනත් කිසියම් කොටසකට හෝ කිසියම් පොදු ගොඩනැගිල්ලකට සම්බන්ධ කර සවිකිරීම, ඇලවීම, එල්ලීම, බැඳ තැබීම හෝ ප්‍රක්ෂේපනය කිරීම කවරකු විසින් හෝ නොකළ යුතු ය.

පළාත් පාලන ආයතනයේ කාර්යභාරය

16. *(අ)* මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ මහා නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන කවර හෝ ප්‍රදේශයක මහා නගර සභාව සතු කිසියම් ඉඩමක හෝ මහා නගර සභාව විසින් ඇතිකර ගනු ලබන ගිවිසුමක් අනුව ලබාගන්නා වෙනත් කිසියම් තැනැත්තෙකු සතු ඉඩමක හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කළ හැකි දැකුම් පැළලි ඉදිකර පවත්වාගෙන යාමට මහා නගර සභාවට බලය තිබිය යුතු ය.

*(ආ)* (අ) ඡේදය යටතේ මහා නගර සභාව විසින් ඉදිකරනු ලැබ ඇති කිසියම් දැකුම් පැළැල්ලක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා මහා නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් ප්‍රදර්ශකයන්ගෙන් අයකර ගැනීමට මහා නගර සභාවට බලය තිබිය යුතු ය.

(ඇ) (අ) ඡේදයේ විධිවිධාන යටතේ මහා නගර සභාව විසින් පනවනු ලබන වාර්ෂික බලපත්‍ර ගාස්තුව පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* නිවේදනය කිරීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

17. *(අ)* ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන කිසියම් ඉල්ලුම්පත්‍රයක් වෙනුවෙන් බලපත්‍රයක් නිකුත් කිරීමට තීරණය කර ඇති අවස්ථාවක, නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ප්‍රමාණයේ ඇප මුදලක් ඉල්ලුම්කරු විසින් මහ නගර සභාවේ තැන්පත් කරනු ලබන තෙක් නාගරික කොමසාරිස්වරයා විසින් එකී ඉල්ලුම්පත්‍රයට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

*(ආ)* කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර නගර සභාවේ තැන්පත් කළ යුතු ඇප මුදල් ප්‍රමාණය පිළිබඳව නගර සභාව විසින් ගනු ලබන තීරණය *ගැසට් පත්‍රයේ* නිවේදනය කිරීම කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

18. *(අ)* අතුරු ව්‍යවස්ථා 9 හි සඳහන් ආකාරයෙන් ක්‍රියාකිරීමෙන් අනතුරුව නාගරික කොමසාරිස්වරයා වෙත ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත අදාළ බලපත්‍රය නිකුත් කිරීමට පෙර මහා නගර සභාවේ තැන්පත් කරනු ලැබූ තැන්පත් මුදල ආපසු ලබා ගැනීමට බලපත්‍රලාභියාට හැකි ය.

*(ආ)* (අ) ඡේදයේ සඳහන් ආකාරයට ලිඛිත ඉල්ලීමක් ලැබීමෙන් අනතුරුව එකී තැන්පත් මුදල බලපත්‍රලාභියා වෙත නිදහස් කිරීමට පෙර -

(i) අතුරු ව්‍යවස්ථා 9 හි සඳහන් නියමයන් බලපත්‍රලාභියා විසින් නිසි ආකාරයෙන් ඉටු කර තිබේද යන බව,

(ii) දැන්වීම ප්‍රදර්ශනය කරනු ලැබ ඇත්තේ මහා නගර සභාව විසින් ඉදි කරන ලද දැකුම් පැළැල්ලක වන අවස්ථාවක, ඒ දැන්වීම ඉවත් කිරීමේ දී හෝ බලපත්‍රලාභියා විසින් වගකිව යුතු කිසියම් කාර්යයක් හේතුවෙන් හෝ එකී දැකුම් පැළැල්ලට කිසියම් හානියක් වී නොමැති බව,

තහවුරු කරගැනීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

*(ඇ)* බලපත්‍රලාභියා විසින් 9 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට ක්‍රියාකර ඇති බව සහ මහා නගර සභාවේ දැකුම් පැළැල්ලට හානියක් සිදුවී නොමැති බව, (ආ) ඡේදයේ සඳහන් ආකාරයට තහවුරු කර ගැනීමේදී නාගරික කොමසාරිස්වරයා සෑහීමට පත්වන්නේ නම් මිස එකී තැන්පත් මුදල බලපත්‍රලාභියා වෙත සම්පූර්ණයෙන් නිදහස් කිරීම නොකළ යුතු ය. කිසියම් බලපත්‍රලාභියෙකු විසින් 9 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක හෝ මහා නගර සභාවේ දැකුම් පැළැල්ලට හානියක් සිදු වී ඇති විට, අවස්ථාවෝචිත පරිදි ඒ කාර්යය කිරීම හෝ දැකුම් පැළැල්ල අළුත්වැඩියා කිරීම හෝ ඒ කාර්යයන් දෙකම සඳහා මහා නගර සභාවට දරන්නට සිදුවන වියදම් තැන්පත් මුදලෙන් අඩු කරගත යුතු අතර ඉතිරිවන යම් මුදල් ප්‍රමාණයක් වේ නම් ඒ මුදල් පමණක් බලපත්‍රලාභියාට ආපසු ගෙවිය හැකි ය.

*(ඈ)* (ඇ) ඡේදයේ සඳහන් ආකාරයට ක්‍රියා කිරීමේ දී මහා නගර සභාවට අයකර ගත යුතු මුදල තැන්පත් කරනු ලැබූ ඇප මුදලට වඩා වැඩිවන අවස්ථාවක, එසේ වැඩිදුරටත් අයවිය යුතු මුදල බලපත්‍රලාභියා විසින් මහා නගර සභාවට ගෙවිය යුතු ය.

අභිමතය/ අත්හැරීම්/නිදහස් කිරීම්

19. මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන කිසියම් ව්‍යාපාරික ස්ථානයක හෝ කර්මාන්ත ශාලාවක නාමය, ලිපිනය සහ එකී ව්‍යාපාරික ස්ථානයේ කරනු ලබන ව්‍යාපාරයේ ස්වභාවය හෝ කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදනවල ස්වභාවය හෝ පෙන්නුම් කෙරෙන දැන්වීම් පුවරු එකක් පමණක් එකී ව්‍යාපාරික ස්ථානයේ හෝ කර්මාන්ත ශාලාවේ ඉදිරිපස ප්‍රදර්ශනය කිරීම, ගෘහ නාම පුවරු සහ කිසියම් දේපළක් බදු දීමට හෝ විකිණීමට හෝ කුළියට දීමට හෝ එකී දේපළ මත ප්‍රදර්ශනය කරනු ලබන "බදු දීමට තිබේ" හෝ "විකිණීමට තිබේ" හෝ "කුළියට දීමට තිබේ" යනුවෙන් සඳහන් වන ප්‍රචාරක දැන්වීම් එකක් පමණක් සඳහා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අදාළ නොවිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයේ දැන්වීම් පුවරු එකකට වැඩි ප්‍රමාණයක් ප්‍රදර්ශනය කරන යම් අවස්ථාවක එසේ වැඩිවන සෑම දැන්වීම් පුවරුවක් ම සඳහා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන බලපැවැත්විය යුතු ය.

20. රජය හෝ පළාත් සභාව හෝ මහා නගර සභාව විසින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක් සම්බන්ධයෙන් මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

21. ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානය : අයකිරීම් හා ගාස්තු

(i) මහ නගර සභාව විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිකළ දැකුම් පැළැල්ලක් වන විට ඒ දකුම් පැළැල්ලේ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ 16(ආ) ඡේදය යටතේ තීරණය කරනු ලැබ ඇති ගාස්තුව මහා නගර සභාවට ගෙවා තිබිය යුතු ය. නැතහොත්

(ii) ඉල්ලුම්කරු නොවන වෙනත් යම් තැනැත්තෙකුට හෝ යම් අධිකාරයකට අයත් ස්ථානයක් වන විට ඒ තැනැත්තා හෝ ඒ අධිකාරය විසින් එකී ප්‍රචාරක දැන්වීම ඒ ස්ථානයේ ප්‍රදර්ශනය කිරීමට අවසර දී ඇති බව තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර තිබිය යුතු ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම මත මහා නගර සභාව වෙත ගෙවනු ලැබිය යුතු බලපත්‍ර ගාස්තුව, එකී බලපත්‍රය සඳහා අයකරනු ලබන ගාස්තුව 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 247අ(2) උපවගන්තියේ 1 වන තීරුවේ සඳහන් වාර්ෂික වටිනාකම සහ ඊට අනුරූපීව 11 වන තීරුවේ සඳහන් උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයේ ගාස්තුවක් විය යුතුවාක් හැර මහා නගර සභාව විසින් එකී ගාස්තුව වාර්ෂිකව පැනවිය යුතු ය.

23. මෙම අතුරු ව්‍යවස්ථා වලට අදාල කටයුතු නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් මහා නගර සභාවට පැවරී ඇති බලය එහි නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේ ය. බලය පැවරීම

24. *(අ)* මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලැබූ කිසියම් බලපත්‍රයක් කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස එකී බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයකද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් හෝ දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර දී ඇති කාලය නිමවීමෙන් පසු අවසන් කළ යුතු ය. බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය

(ආ) කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍රයේ කාලය අවසන් වීමෙන් අනතුරුව අනුගාමී වර්ෂය තුළදී ද එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වන අවස්ථාවක ඒ අනුගාමී වර්ෂය සඳහා එකී දැන්වීම ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් නව බලපත්‍රයක් ලබාගත යුතු ය. එසේ වුව ද ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට නිකුත් කරනු ලබන බලපත්‍රයක් වෙනුවෙන් අනුගාමී වර්ෂය තුළ අයකිරීමට මහා නගර සභාව සම්මත කර ඇති බලපත්‍ර ගාස්තුව කුමක් වුවද එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය සඳහා නිකුත් කරනු ලබන නව බලපත්‍රය වෙනුවෙන් කලින් සම්මත කළ බලපත්‍ර ගාස්තුව අදාළ විය යුතු ය.

25. *(අ)* කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවිකිරීම සඳහා යොදා ගනු ලබන කවර අන්දමේ හෝ දැකුම් පැළැල්ලක්, ආධාරකයක්, ඉදිකිරීමක් හෝ සවිකිරීමක් පරිසරයට හානි වන ආකාරයේ හෝ කිසියම් තැනැත්තෙකුට හෝ යම් තැනැත්තෙකුගේ දේපලකට අන්තරාදායකවන හෝ හානිවන ආකාරයේ පවතින අවස්ථාවක එය නිශ්චිත කාලයක් ඇතුළත යථා තත්ත්වයට පත් කරන ලෙස බලපත්‍රලාභියාට යොමු කරන දැන්වීමක් මගින් නියම කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියාට බලය තිබිය යුතු ය. පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය

(ආ) (අ) ඡේදය යටතේ වන දැන්වීමක් ලැබූ කවර හෝ තැනැත්තෙකු එකී දැන්වීමේ සඳහන් කාලය තුළ ඒ දැන්වීමේ සඳහන් නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක දී නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් එකී ප්‍රචාරක දැන්වීම සඳහා නිකුත් කළ බලපත්‍රය අවලංගු කිරීම සහ ඒ ප්‍රචාරක දැන්වීම ගලවා ඉවත් කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(ඇ) ඉහත (ආ) ඡේදයේ විධිවිධාන යටතේ කිසියම් බලපත්‍රයක් අවලංගු කර ඇති අවස්ථාවක එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා මහා නගර සභාවේ තැන්පත් කරනු ලැබ ඇති ඇප මුදල මහා නගර සභාව සතු විය යුතුවාක් හැර ඒ ඇප මුදල ඉල්ලා සිටීමට වෙනත් කවර හෝ තැනැත්තෙකුට අයිතිවාසිකමක් නොතිබිය යුතු ය.

26. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ඉදිකිරීම සඳහා පාවිච්චි කරන කවර හෝ ඉදිකිරීමක ආධාරකයක්, සවිකිරීමක් හෝ ඒ සඳහා පාවිච්චි කරන වෙනත් යම් කිසිවක් නිසා හෝ එකී ප්‍රචාරක දැන්වීමෙන් ප්‍රකාශිත අර්ථය හෝ ගම්‍ය වන අනාර්ථයක් හේතුවෙන් කිසියම් පාර්ශ්වයකට සිදුවන හෝ සිදුවීමට ඉඩ ඇති කිසියම් අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් බලපත්‍රලාභියා වගකීමට යටත් විය යුතු ය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය

27. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් මගින් එකී ප්‍රචාරක දැන්වීමේ සඳහන් අර්ථය හෝ ප්‍රකාශිතය ඉදිරිපත් කිරීම සඳහා දෙනු ලැබූ නීතිමය අවසරයක් ඇතුළත් වූ ලෙස නොසැලකිය යුතු අතර එලෙස තේරුම් ගැනීම ද නොකළ යුතු ය.

28. යම් කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචිකව මහා නගර සභාවේ නගරාධිපති නාගරික කොමසාරිස් හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබා දෙන්නේය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

29. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩකිරීම වරදක් වන්නේ ය.

30. මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ නියමයක් කඩ කර ඇති අවස්ථාවක ඒ කඩකිරීම පිළිබඳව අවධානය යොමු කරන නිවේදනයක් සමග නිකුත් කරනු ලැබූ කිසියම් බලපත්‍රයක් අවලංගු කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියාට බලය තිබිය යුතු ය.

දඩ හා දණ්ඩන

31. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් වූ කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම හෝ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි (03) වන උපවගන්තියෙහි සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී 267 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

අර්ථ නිරූපනය හා නිර්වචන

32. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල -

"නගරාධිපතිවරයා " සහ "නියෝජ්‍ය නගරාධිපතිවරයා" යන යෙදුම් වලින් පිළිවෙලින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරාපත් කර ගන්නා ලද මහ නගර සභාවේ නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා අදහස් වේ.

"නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වන අතර ඒ සභාවේ යම් නියෝජ්‍ය හෝ සහකාර නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙක් ද කොමසාරිවරයාගේ බලතල කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම ඉටුකිරීම හෝ කිරීම සඳහා මහ නගර සභා ආඥා පනතින් හෝ ඒ යටතේ බලය පවරනු ලැබූ යම් නිලධාරියෙක් ද ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණයට ඊට ඇතුලත් වේ.

"මහ නගර සභාව" යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාව ද අදහස් වේ.

"බලයලත් නිලධාරි" යන්නෙන්, තත්කාර්ය සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ කුරුණෑගල මහා නගර සභාවේ යම් නිලධාරියෙකු ද අදහස් වේ.

"රථවාහන පොලිස් ස්ථානාධිපති " යන්නෙන්, තත්කාර්යය සඳහා මූලස්ථාන පොලිස් ස්ථානාධිපති විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ කුරුණෑගල පොලිස් ස්ථානයේ යම් නිලධාරියෙකු ද අදහස්වේ.

"කටවුට්" යන්නෙන්, ලී හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් යොදා ගනිමින් සකස් කළ කිසියම් රාමුවක අලවන හෝ සවිකරන ලද ප්‍රචාරක දැන්වීමක්ද,

"දැකුම් පැළැල්ල" යන්නෙන්, ජනතාවගේ දැනගැනීම හෝ අවධානය සඳහා ප්‍රදර්ශනය කරනු ලබන කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවි කිරීම හෝ රඳවා තැබීම පිණිස ඉදිකරනු ලබන කවර හෝ ආකාරයක ස්ථිර පුවරුවක් ද,

"ප්‍රචාරක දැන්වීම" යන්නෙන්, කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක හෝ නිර්මිතයක ඉහළින් හෝ ඒ මත සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් ප්‍රදර්ශනය කරනු ලබන හා ජනතාවගේ දැනගැනීම හෝ අවධානය පිණිස ප්‍රදර්ශනය කරන, අලවන, සවිකරන, ඉදිකරන, එල්ලා තබන හෝ වෙනත් ආකාරයකින් ස්ථානගත කරනු ලබන ප්‍රචාරන කාර්යය සඳහා යොදා ගනු ලබන හෝ කිසියම් අක්ෂර හෝ වචන හෝ රූප සටහන් හෝ ඇතුළත් වන ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් හෝ කටවුට් එකක් හෝ කිසියම් ආකාරයක අනුරුවක් හෝ දැන්වීමක් හෝ නිවේදනයක් හෝ වෙළඳ දැන්වීමක් ද,

අදහස් වේ.

*පළමුවැනි උපලේඛනය*

කුරුණෑගල මහා නගර සභාව

***දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය***

කුරුණෑගල නාගරික කොමසාරිස්තුමා වෙතටයි.

01. ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය : ................................................
ජාතික හැඳුනුම්පත් අංකය : ................................................ දුරකථන අංකය : ................................................

02. ඉල්ලුම්කරු නොපැමිණෙන්නේ නම් :................................................
නියෝජිතයාගේ නම සහ ලිපිනය : ................................................
ජාතික හැඳුනුම්පත් අංකය : ................................................ දුරකථන අංකය : ................................................

03. දැන්වීම් සම්බන්ධ විස්තර :

| | *ප්‍රදර්ශනය කරන ස්ථානය* | *දිග x පළල (අඩි)* | *වර්ග අඩි ප්‍රමාණය* | *ප්‍රදර්ශනය වන පැති ගණන* | *දැන්වීම් ගණන* |
|---|---|---|---|---|---|
| (i) | ..................... | ..................... | ..................... | ..................... | ..................... |
| (ii) | ..................... | ..................... | ..................... | ..................... | ..................... |
| (iii) | ..................... | ..................... | ..................... | ..................... | ..................... |
| (iv) | ..................... | ..................... | ..................... | ..................... | ..................... |
| (v) | ..................... | ..................... | ..................... | ..................... | ..................... |

04. ප්‍රදර්ශනය කරන්නට යෙදෙන දැන්වීමේ විස්තරය :................................................
(දැන්වීමේ පිටපතක් අමුණා එවිය යුතුය.)

05. දැන්වීම ප්‍රදර්ශනය කරන කාලය .......................... සිට ...................... දක්වා

කුරුණෑගල මහා නගර සභාවේ අතුරු ව්‍යවස්ථාවන්ට එකඟව දැන්වීම ප්‍රදර්ශනය කිරීමටත්, නියමිත දිනට දැන්වීම ඉවත් කර ගැනීමටත් මේ හා සම්බන්ධයෙන් මහා නගර සභාව විසින් නිකුත් කරනු ලබන නිගමනයන් හා උපදේශනයන් පිළිපැදීමටත්, මම මෙයින් පොරොන්දු වෙමි. එම කොන්දේසි කඩ කළහොත් ඇප මුදල් නගර සභාව සතුවන බවත් දනිමි.

තවද, මෙහි සඳහන් විස්තර නිවැරදි බවටත්, සත්‍ය බවටත් සහතික කරමි.

යම් හෙයකින් මෙහි සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව හෙළිවුවහොත්, මා විසින් ඉදිරිපත් කර ඇති සියළුම බැනර් නගර සභාව සතු කිරීමටත්, ප්‍රදර්ශනය කිරීමෙන් පසු හෙළිවුවහොත්, ඒ සියල්ල කපා ඉවත් කර , නගර සභාව සතු කිරීමටත් යටත් වන බවට එකඟ වෙමි.

............................
අයදුම්කරුගේ අත්සන.

දිනය : ............................

ප්‍රධාන නාගරික ගණකාධිකාරි,
ඉහත ස්ථාන නිර්දේශ කරමි. /නොකරමි/සංශෝධනය කර නිර්දේශ කරමි.
නා.ග/ආර් 1

........................................................
නාගරික ඉංජිනේරුගේ අත්සන.

| | *දිග පළල ප්‍රමාණය* | *වර්ග අඩි ප්‍රමාණය* | *දැන්වීම් ගණන* | *ප්‍රදර්ශනය වන පැති ගණන* | *මුලු අඩි ප්‍රමාණය* |
|---|---|---|---|---|---|
| (i) | ..................... | ..................... | ..................... | ..................... | ......................... |
| (ii) | ..................... | ..................... | ..................... | ..................... | ........................ |
| (iii) | ..................... | ..................... | ..................... | ..................... | ........................ |
| (iv) | ..................... | ..................... | ..................... | ..................... | ........................ |
| (v) | ..................... | ..................... | ..................... | ..................... | ........................ |

මුළු වටිනාකම රු. ..................................................
එකතු කළ ආදායම් මත වැට් බද්ද 12% රු. ................................................

| | |
|---|---|
| ජාතිය ගොඩනැගීමේ බද්ද (N.B.T.2%) | රු. .................................... |
| මුළු මුදල | රු. ............................................ |
| අපේක්ෂිත ඇප මුදල් | රු. :.............................................. |
| ගෙවිය යුතු සම්පූර්ණ මුදල | රු. :.............................................. |

.......................
විෂය ලිපිකරු අනුමත කරමි./අනුමත නොකරමි.

............................................................
නාගරික ප්‍රධාන ගණකාධිකාරි/නාගරික
ගණකාධිකාරි නාගරික කොමසාරිස් වෙනුවට.

නාගරික ඉංජිනේරු,

ඔබගේ ..................................... නිර්දේශය අනුව පහත සඳහන් විස්තර සහිත දැන්වීම් ප්‍රදර්ශනය සඳහා මුද්‍රා තැබූ අතර එම දැන්වීම් වල කාලය ඉකුත් වූ පසුව ප්‍රදර්ශනය කළහොත් එම දැන්වීම් නගර සභාව සතු කර ඒ බව අප වෙත කරුණාකර දන්වන්න.

දැන්වීම් ආයතනය :................................................ අංකය :................................................

| | ස්ථානය | දැන්වීම් ගණන | දැන්වීමේ ප්‍රමාණය | කල්පිරෙන දිනය |
|---|---|---|---|---|
| (i) | ..................... | ..................... | ..................... | ....................... |
| (ii) | .................... | ..................... | ..................... | ....................... |
| (iii) | ..................... | ..................... | ..................... | ....................... |
| (iv) | ..................... | ..................... | ..................... | ....................... |
| (v) | ..................... | ..................... | ..................... | ....................... |

.................................................................
ප්‍රධාන නාගරික ගණකාධිකාරී/
නාගරික ගණකාධිකාරී.

ප්‍රධාන නාගරික ගණකාධිකාරී

1. ආයතනයේ නම :................................................
2. දැන්වීම් අංකය :................................................

පහත සඳහන් ස්ථානවල දැන්වීම් ඉවත් කර නොතිබූ ඒවා නගර සභාව සතු කරන ලදී.

(i) .....................
(ii) ....................
(iii) .....................
(iv) .....................
(v) .....................

.................................................................
නාගරික ඉංජිනේරු.

ප්‍රධාන ආදායම් පරීක්ෂක,

............................................ දින අනුමත කර මුද්‍රා තබන ලද පහත සඳහන් දැන්වීම්වල කාලය ඉකුත් වූ වහාම ඒවා ඉවත් කර නොමැති නම් මා වෙත කරුණාකර වාර්තා කරන්න.

දැන්වීම් ආයතනය : .................................................................. අංකය :.................................

| | ස්ථානය | දැන්වීම් ගණන | දැන්වීමේ ප්‍රමාණය | කල්පිරෙන දිනය |
|---|---|---|---|---|
| (i) | ..................... | ..................... | ..................... | ....................... |
| (ii) | ..................... | ..................... | ..................... | ....................... |
| (iii) | ..................... | ..................... | ..................... | ....................... |
| (iv) | ..................... | ..................... | ..................... | ....................... |

.................................................................
ප්‍රධාන නාගරික ගණකාධිකාරී/නාගරික ගණකාධිකාරී.

1. ආයතනයේ නම : ..................................................................
2. දැන්වීම් අංකය : ..................................................................

පහත ස්ථානවල දැන්වීම් නියමිත පරිදි ඉවත් කර නැත.

(i) .....................
(ii) .....................
(iii) .....................
(iv) .....................
(v) .....................

.................................................................
ප්‍රධාන ආදායම් පරීක්ෂක.

06-645/4

## කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය තුළ නවාතැන් පොළවල් පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

252 හා අධිකාරිය වන 1947 අංක 16 දරන මහ නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියේ පළවන උපවගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 272 වන වගන්තියේ (22) වන උපවගන්තියෙන් මහා නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව කුරුණෑගල මහා නගර සභාව විසින් සාදනු ලැබූ සහ 2014.09.30 පැවති එකී මහා නගර සභාවේ 4(01) දරන යෝජනාවෙන් සභා සම්මත වී ඇති මෙහි පහත උපලේඛනයෙන් දැක්වෙන කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය තුළ නවාතැන් පොළවල් පවත්වාගෙන යාම විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික) විධිවිධාන පනතේ දෙවන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී මහා නගර සභා ආඥාපනතේ 268 වන වගන්තියේ (1) වන උප වගන්තිය ප්‍රකාරව වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය දයාසිරි ජයසේකර වන මවිසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නීතිඥ ජේ. පී. දයාසිරි පද්මකුමාර ජයසේකර,
වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍ය,

2015 ජූනි මස 05 වැනි දින,
වයඹ ප්‍රධාන අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

උපලේඛනය

### කුරුණෑගල මහා නගර සභා ප්‍රදේශය තුළ නවාතැන් පොළවල් පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. මෙම අතුරු ව්‍යවස්ථා කුරුණෑගල මහා නගර සභා ප්‍රදේශය තුළ නවාතැන්පොළවල් පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ. — අතුරු ව්‍යවස්ථාවේ නාමය

2. කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන නවාතැන් පොළවල් මහජන සෞඛ්‍ය ආරක්ෂා වන අයුරින් සහ පරිසර හිතකාමීව පවත්වාගෙන යාම මෙම අතුරු ව්‍යවස්ථාවේ අරමුණවේ. — අරමුණ

3. මහා නගර සභා ආඥා පනතේ 267(1) වගන්තිය සමග කියවිය යුතු 272(22) උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙමඅතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත. — අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

4. උපලේඛන 1 හි දැක්වෙන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් බලපත්‍ර ලබාගැනීම බලපත්‍රලාභියාගේ කාර්ය සහ වගකීම වන්නේය. — ඉටුකළ යුතු කාර්යයන්

5. මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ හෝටලයකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(1) ස්ථානය මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(2) ස්ථානයේ සෑම කාමරයකම බිත්ති මීටර් 2.5කට නොඅඩු උසකින් යුක්ත විය යුතු අතර එකී බිත්ති ගඩොලින්, සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් තනා තිබිය යුතු අතර දෙපැත්ත ම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය. එසේ වුව ද මුලුතැන්ගේ හැර වෙනත් කාමර ලීයෙන් හෝ කිසියම් ලෝහ තහඩු වර්ගයකින් හෝ ලී හා කිසියම් ලෝහ තහඩු වර්ගයකින් තනා තීන්ත ආලේප කර තිබීම මේ නියමයට අනුකූලවන ලෙස සැලකිය යුතු ය.

(3) ස්ථානයේ සෑම කාමරයක ම සීලිමක් බැගින් සවිකර තිබිය යුතු අතර එකී සීලිම පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(4) සෑම කාමරයකටම විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර, ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කළ විට ඒ ජනේලවල කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ග ඵලයෙන් පහළොවෙන් එකකට නොඅඩු විය යුතු ය. එසේ වුව ද කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාළ නොවිය යුතු ය,

(5) වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු ය,

(6) පියසි කෙළවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2කට උසින් පිහිටා තිබිය යුතු අතර, අගු වාසිය අවම වශයෙන් මීටර් 1.5ක් විය යුතු ය,

(7) සෑම කාමරයකම බිම සිමෙන්ති දමා කපලාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය,

(8) ස්ථානය තුළ ජනනය වන කසළ රැස්කිරීම සඳහා කසළ භාජන තබා තිබිය යුතු අතර, මුළුතැන්ගෙය තුළ තබන කසළ භාජන මැස්සන් හෝ වෙනත් කෘමි සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් තිබිය යුතු ය.,

(9) ස්ථානය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා 15 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමයන් අනුව ක්‍රියා කළ හැකි ආකාරයට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබිය යුතු ය,

(10) ස්ථානයේ මුළුතැන්ගෙය තුළ පාවිච්චියට ගනු ලබන සෑම මේසයක් ම -

*(අ)* ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර, එකී මේසය මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය,

*(ආ)* යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර, මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය,

(11) ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට තබා ඇති සෑම මේසයක් ම -

*(අ)* ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර, එකී මේසය මතුපිට වීදුරු තහඩුවකින් හෝ ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය,

*(ආ)* යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර, වීදුරු තහඩුවකින් හෝ මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය,

(12) ස්ථානයේ පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර අවම වශයෙන් සෑම මාස හයකට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතු ය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය ස්ථානයේ පාවිච්චිය සඳහා යොදා ගන්නේ නම් එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(13) ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩාකර තබන්නේ නම් එසේ ගබඩාකර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(14) ගනුදෙනුකරුවන් විසින් පාවිච්චියට ගනු ලැබූ භාජන සේදීම සඳහා වෙනම කොටසක් ස්ථානයේ පවත්වාගෙන යා යුතු ය.

(15) සේවකයන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දහදෙනෙකුටම එකක් බැගින් වනසේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වූ වැසිකිළි හා කැසිකිළි ද ගනුදෙනුකරුවන්ගේ පොදු පරිහරණයට වෙන් කළ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වූ වැසිකිළි හා කැසිකිළි එකක් තනා තිබිය යුතු ය.

(16) සෑම වැසිකිළියක හා කැසිකිළියක ම බිත්ති ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන්, කබුක් ගලෙන් හෝ මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් තනා බිම සිමෙන්තියෙන් කපලාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය. එසේ ම තවදුරටත් ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් තැනූ බිත්ති වන විට ඒවා කපලාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු වන අතර, මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් තැනූ බිත්ති වනවිට ඒවා මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතු ය,

(17) ස්ථානයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ පාවිච්චිය සඳහා නාන කාමර ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු අතර, (16) වැනි ඡේදයේ සඳහන් වැසිකිළිවලට අදාළ නියමයන් එකී නාන කාමරවල බිමට සහ බිත්තිවලට අදාළ විය යුතු ය,

(18) ස්ථානයේ ගණුදෙනුකරුවන්ගේ පාවිච්චියට වෙන්කළ කොටස තුළ ගණුදෙනුකරුවන්ගේ අත් සේදීමට මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් හෝ පිඟන් මැටියෙන් තනා ඔපදැමූ හෝ ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් බැඳ පිඟන් ගඩොල් ඇල්ලූ බේසම් තනා තිබිය යුතු ය,

(19) ස්ථානයේ කවර හෝ කොටසක පාවිච්චියෙන් පසු බැහැර කරන අප ජලය අවහිරයකින් තොරව ගලා යාමට සුදුසු කාණු පද්ධතියක් ඇතිකර තිබිය යුතු ය,

(20) මහා නගර සභාව විසින් ජලාපවහන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන්නේ නම් ස්ථානයෙන් බැහැර කරන අපජලය මහ නගර සභාව විසින් නියම කරනු ලබන ආකාරයෙන් එකී ජලාපවහන පද්ධතියට ගලා යාමට සැලැස්විය හැකි අතර, එසේ නොවන අවස්ථාවක එකී අප ජලය උරා ගන්නා වළකට ගලායාමට සලස්වා තිබිය යුතු ය,

(21) ස්ථානයේ සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු අතර, ස්ථානයට විදුලිය සම්බන්ධතාව ලබාගෙන ඇත්නම් අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය,

(22) ස්ථානයේ තේ, කෝපි හෝ කිරි පිළියෙල කරනු ලබන කොටස පිරිද්දුම් නැති මළ නොබැඳෙන ලෝහ තහඩුවකින් හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ආවරණය කර තිබිය යුතු ය,

(23) ස්ථානයේ ගණුදෙනුකරුවන්ට හා සේවකයන්ට නිදාගැනීමට වෙන්කළ නිදන කාමරවල එක් තැනැත්තෙකුට නිදා ගැනීමට වෙන්කළ ඉඩ ප්‍රමාණය අවම වශයෙන් මීටර් හතරකට නොඅඩු විය යුතු අතර, සෑම නිදන කාමරයකම ඇඳක්, ඇඳුම් තැබීමට අල්මාරියක් හෝ කැබිනෙට්ටුවක්, තුවා රාක්කයක් නවාතැන්කරුගේ හෝ නවාතැන්කරුවන්ගේ භාණ්ඩ තැබීමට මේසයක් හා වැසිකිළියක් සහිත නාන කාමරයක් තිබිය යුතු ය.

6. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ඉල්ලා සිටින කවර හෝ තැනැත්තෙකු විසින් මේ කොටසේ උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කළ ඉල්ලුම්පත්‍රයක් නාගරික කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

7. තීන්ත ආලේප කර තිබිය යුතු යැයි 10 සහ 11 වන අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති සෑම කොටසක ම අවම වශයෙන් අවුරුද්දකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

8. බලපත්‍රලත් ස්ථානය අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් ඇමදීම කළ යුතු අතර, අපජලය බැසයන කාණු අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදුකර ජලයෙන් සෝදා හැරීම කළ යුතු ය.

9. බලපත්‍රලත් ස්ථානයෙහි රාත්‍රිය නතර වී සිටීමට පැමිණෙන එක් එක් තැනැත්තාගේ නම, ලිපිනය හා අනන්‍යතාව සටහන් කරන ලේඛනයක් සෑම බලපත්‍රලත් ස්ථානයක ම පවත්වා ගත යුතු අතර, නාගරික කොමසාරිස්වරයා, බලයලත් නිලධාරියා හෝ කිසියම් පොලිස් නිලධාරියෙකු විසින් පරීක්ෂා කිරීමට ඉල්ලා සිටින අවස්ථාවක දී එකී ලේඛනය පරීක්ෂා කිරීමට ඉඩදීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

10. බලපත්‍රලත් ස්ථානයේ සෑම නිදන කාමරයකම එක් ගනුදෙනුකරුවෙකු විසින් පාවිච්චි කරනු ලැබීමෙන් අනතුරුව තවත් ගනුදෙණුකරුවෙකුගේ පාවිච්චියට ඉඩදීමට පෙර එකී නිදන කාමරයේ ඇඳ ඇතිරිලි, කොට්ට උර, පොරෝනා, තුවා සහ පාවිච්චි කළ වෙනත් රෙදි සෝදා පිරිසිදු කිරීමෙන් අනතුරුව මිස අනෙක් ගණුදෙනුකරුවකුගේ පාවිච්චියට සැලැස්වීම නොකළ යුතුවාක් හැර පසුව පැමිණෙන ගනුදෙනුකරුවාට එකී කාමරය පාවිච්චි කිරීමට ඉඩ දීමට පෙර එකී කාමරයේ ජනේල අවම වශයෙන් පැය හතරක්වත් සම්පූර්ණයෙන් විවෘත කර තැබීමට සැළැස්විය යුතුය.

11. සෑම බලපත්‍රලත් ස්ථානයකම සෑම කාමරයක්, හිණිපෙලක්, ආලින්දයක්, කාණුවක් සහ එකී ස්ථානයට අයත් ඉඩම ද සෑම දිනකම මධ්‍යහ්නයට පෙර අතුගෑමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේය.

12. බලපත්‍රලත් ස්ථානයේ ඇති වැසිකිළි සහ කැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර විෂබීජ නාශක යෙදීම කළ යුතු අතර, දුර්ගන්ධය වහනය වීමෙන් තොරව පවත්වාගත යුතු ය. එසේ වුව ද ගනුදෙනුකරුවන් නවාතැන් ගන්නා කිසියම් කාමරයක වැසිකිළි දිනකට එක් වරක් පිරිසිදු කිරීම ප්‍රමාණවත් ලෙස සැලකිය හැකිය.

13. බලපත්‍රලත් ස්ථානයේ ආහාරපාන පිළියෙල කිරීමට, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට සහ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට ගනු ලබන භාණ්ඩ, භාජන හා උපකරණ සෑම එකක්ම ඒවා පාවිච්චියට ගැනීමට පෙර පිරිසිදු ජලයෙන් සෝදා ගත යුතු අතර පාවිච්චි කිරීමෙන් පසුව සෝදා පිරිසිදු කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

14. බලපත්‍ර ලත් ස්ථානයේ ඒ ඒ කොටසේ එකතු වන සියලුම කසළ 19 වන අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ආකාරයෙන් වර්ග කර අපාරගම්‍ය ද්‍රව්‍යයකින් තැනූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු අතර, එකී කසළ අවම වශයෙන් එක් වරක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් ඒ ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර එකී

භාජනවලට කසළ බහාලන අවස්ථාවේ දී හා ඉවත් කිරීමේ දී හැර අන් සියලු වේලාවන් වලදී එම භාජනය හොඳින් වසා තැබිය යුතු ය.

15. *(අ)* බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය,
(ii) වීදුරු,
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ,
(vii) අන්තරායකර අපද්‍රව්‍ය,

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

*(ආ)* ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ගකර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය මහ නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතු ය.

16. සෑම බලපත්‍රලත් ස්ථානයක් ම මීයන්ගෙන්, මැස්සන්ගෙන් හෝ වෙනත් කෘමීන්ගෙන් තොරව පවත්වා ගත යුතු අතර එකී ස්ථානයේ තබා ගන්නා ආහාර හෝ පාන පිළියෙල කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය හා පිළියෙල කළ ආහාර හෝ පාන එකී සතුන්ගෙන් දූෂණය වීම වැළැක්වීමට අවශ්‍ය සියලුම විධිවිධාන සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

17. ගණුදෙනුකරුවන්ට ආහාර පිළිගැන්වීමේ දී ඒවා අතින් ඇල්ලීම නොකළ යුතු අතර එකී ආහාර පිළිගැන්වීම සඳහා හැන්දක් හෝ ගෑරුප්පුවක් හෝ වෙනත් ආකාරයක උපකරණයක් යොදා ගත යුතු ය.

(ඇ) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතු ය.

18. බලපත්‍රලත් ස්ථානයේ ආහාර හෝ පාන පිළියෙල කිරීමේ නියුක්ත සෑම සේවකයෙකු වෙත ම පිළිවැසුම් සපයා තිබීමත්, එකී සේවකයන් කාර්යයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී පිළිවැසුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

19. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහා ම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතු ය.

නොකළ යුතු කාර්යයන්.

20. නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තනැත්තෙකු විසින් මහ නගර සභා ප්‍රදේශය තුළ නවාතැන් පොළක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

21. බලපත්‍රලත් ස්ථානයෙහි නිදන කාමර වශයෙන් නිශ්චිතව වෙන් කර ඇති කාමරයක හැර වෙනත් කිසියම් කාමරයක කවර හෝ තැනැත්තෙකුට නිදාගැනීමට ඉඩදීම නොකළ යුතු ය.

22. 5 වන අතුරු ව්‍යවස්ථාවේ (23) වන ඡේදයේ සඳහන් අවම ඉඩ ප්‍රමාණයට නොසැසඳෙන තැනැත්තන් සංඛ්‍යාවක් යම් නිදන කාමරයක නිදා ගැනීමට ඉඩ දීම නොකළ යුතු ය.

23. කිසියම් නවාතැන් පොළක තනි කාමරයක එක් තැනැත්තෙකුට වැඩියෙන් හෝ යුගල කාමරයක දෙදෙනෙකුට වැඩියෙන් හෝ ත්‍රිත්ව කාමරයක තුන් දෙනෙකුට වැඩියෙන් හෝ නිදාගැනීමට ඉඩදීම බලපත්‍රලාභියා විසින් නොකළ යුතු ය. එසේ වුව ද මේ කිසියම් කාමරයක නිදා ගන්නා යම් තැනැත්තෙකු වයස අවුරුදු 12 ට අඩු අයෙකු වන විට මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා ඔහු එක් අයෙකු ලෙස සැලකීම නොකළ යුතු ය.

24. කිසියම් නවාතැන් පොළක රාත්‍රී නවාතැන් ගන්නා සෑම තැනැත්තෙකු ම තම අනන්‍යතාව බලපත්‍රලාභියා වෙත ඉදිරිපත් කළ යුතු අතර, නවාතැන් පොළෙහි පවත්වාගෙන යනු ලබන අමුත්තන්ගේ ලේඛනයෙහි තමාගේ තොරතුරු ඇතුළත් කරන තීරුවේ තම නම අත්සන් කළ යුතු ය. එසේ ම තම අනන්‍යතාව ඉදිරිපත් නොකරන හෝ අමුත්තන්ගේ ලේඛනයෙහි තම අනන්‍යතාව පිළිබඳ තොරතුරු ඇතුළත් තීරුවේ නම අත්සන් කිරීම නොකරන කවර හෝ තැනැත්තෙකුට බලපත්‍රලත් ස්ථානයේ කවර හෝ කොටසක රාත්‍රී කාලයේ නවාතැන් ගැනීමට සැලැස්වීම බලපත්‍රලාභියා විසින් නොකළ යුතු ය.

25. කවර හෝ නවාතැන් පොළක සදාචාර විරෝධී කාර්යයන් සඳහා යොදා ගැනීමට ඉඩනොදීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර කවර හෝ තැනැත්තෙකු විසින් නවාතැන් පොළෙහි වෙනත් නවාතැන්කරුවන්ගේ හෝ නවාතැන් පොළ ආසන්නයේ පදිංචිකරුවන්ට බාධාවක් වන ආකාරයෙන් ගීත ගායනා කිරීම හෝ තැටි වාදන යන්ත්‍ර ක්‍රියා කරවීම හෝ අනවශ්‍ය ආකාරයේ ශබ්ද ඇති කිරීම හෝ නොකළ යුතු ය.

26. බලපත්‍රලත් ස්ථානයේ කිසියම් නිදන කාමරයක, ආහාර පිළියෙල කරනු ලබන ස්ථානයක හෝ ආහාර ගැනීමට වෙන්කළ කිසියම් කොටසක කවර හෝ සත්ත්වයෙකු තබා ගැනීම නොකළ යුතු ය.

27. බලපත්‍රලත් ස්ථානයෙන් ඉවත දමන කසළ කවර හෝ අවස්ථාවක ස්ථානයේ බිම හෝ තැනින් තැන දැමීම නොකළ යුතු ය.

28. කිසියම් බලපත්‍රලත් ස්ථානයක ඇති නිදන කාමර ඇතුළත කවර හෝ අවස්ථාවක -

(අ) තනි කාමරයක එක් ඇඳකට වැඩියෙන් ද,
(ආ) යුගල කාමරයක ද්විත්ව ඇඳක් හෝ තනි ඇඳන් දෙකකට වැඩියෙන් ද,
(ඇ) ත්‍රිත්ව කාමරයක ද්විත්ව ඇඳක් හා තනි ඇඳකට හෝ තනි ඇඳන් තුනකට වැඩියෙන් ද,
(ඈ) පවුල් කාමරයක ද්විත්ව ඇඳන් දෙකක් හා තනි ඇඳක් හෝ ද්විත්ව ඇඳන් එකක් හා තනි ඇඳන් තුනක් හෝ තනි ඇඳන් පහකට වැඩියෙන් ද,
තැබීම නොකළ යුතු ය.

29. කවර හෝ බලපත්‍රලත් ස්ථානයක බාලකළ කිරි කිසිවක් තබා ගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතු ය. මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා බාලකළ කිරි යන්නෙන් ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයන් එකතු කළ කිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 85කට අඩු හෝ කිරිමේද සියයට 35කට අඩු එළකිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 9 ක හෝ කිරි මේද සියයට 7 කට අඩු මී කිරි අදහස් වේ.

30. (අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙ හි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

31. නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බලපත්‍රලත් ස්ථානයක පිළියෙල කරන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබාගැනීම නීත්‍යානුකූල විය යුතුවාක් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිළ දී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

32. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් හෝටලයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය. පළාත් පාලන ආයතනයේ කාර්යභාරය.

33. කිසියම් නවාතැන්පොළක් පවත්වාගෙන යාම සඳහා මහ නගර සභා ආඥාපනතේ 247(අ) 2 උපවගන්තියේ සඳහන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට සභාවට බලය ඇත්තේ ය. අයකිරීම් හා ගාස්තු.

34. මෙහි බලය පැවරීම මෙම අතුරු ව්‍යවස්ථාව නියමනය කිරීම සම්බන්ධයෙන් එහි නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේ ය බලය පැවරීම.

35. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතු ය. බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය.

36. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ. පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය.

37. 30 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

38. 31 වැනි වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමසාරිස්වරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

39. නියමයක් යටතේ බලපත්‍ර ලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට පරීක්ෂා කිරීම සඳහා සහායවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය. එසේම එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධාකිරීමක් නොකල යුතු ය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය

40. යම් කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචික මහා නගර සභාවේ නගරාධිපති, නාගරික කොමසාරිස් හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබා දෙන්නේ ය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

41. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය.

දඩ හා දණ්ඩන

42. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳවූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 267 වන වගන්තියෙහි (3) වගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංගණය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි (3) වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

අර්ථ නිරූපනය හා නිර්වචන

43. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල —

"නගරාධිපතිවරයා " යන්නෙන් කුරුණෑගල මහ නගර සභාවේ නගරාධිපතිවරයා හෝ නගරාධිපතිවරයාගේ බලතල, කාර්ය හා කර්තව්‍ය පැවරී ඇති යම් තැනැත්තෙක් ද අදහස් වේ.

"නියෝජ්‍ය නගරාධිපතිවරයා " යන්නෙන්, කුරුණෑගල මහා නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපතිවරයා ද,

"නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, කුරුණෑගල මහා නගර සභාවේ කොමසාරිස්වරයා හෝ එකී කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හා කර්තව්‍ය පැවරී ඇති යම් නිලධාරියෙකු ද,

"මහ නගර සභාව" යන්නෙන්, කුරුණෑගල මහ නගර සභාව ද අදහස් වේ.

"පවුල් කාමරය'' යන්නෙන්, එකවර තැනැත්තන් පස් දෙනෙකුට නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ ද්විත්ව ඇඳන් දෙකක් හා තනි ඇඳක් හෝ ද්විත්ව ඇඳන් එකක් හා තනි ඇඳන් තුනක් හෝ තනි ඇඳන් පහක් සහිත කාමරයක් ද,

''තනි ඇඳ'' යන්නෙන් අවම වශයෙන් දිග සෙන්ටි මීටර් 200ක් හා පළල සෙන්ටි මීටර් 95ක් වූ මෙට්ටයක් සහිත ඇඳක් ද ;

''තනි කාමරය'' යන්නෙන්, එක් තැනැත්තෙකුට පමණක් නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ තනි ඇඳක් සහිත කාමරයක් ද ;

''ත්‍රිත්ව කාමරය'' යන්නෙන් එකවර තැනැත්තන් තුන් දෙනෙකුට නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ ද්විත්ව ඇඳක් හා තනි ඇඳක් හෝ තනි ඇඳන් තුනක් සහිත කාමරයක් ද ;

''යුගල ඇඳ'' යන්නෙන්, අවම වශයෙන් දිග සෙන්ටි මීටර් 200ක් හා පළල සෙන්ටි මීටර් 125ක් වූ මෙට්ටයක් සහිත ඇඳක් ද ;

''යුගල කාමරය'' යන්නෙන්, එකවර තැනැත්තන් දෙදෙනෙකුට නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ ද්විත්ව ඇඳක් හෝ තනි ඇඳන් දෙකක් සහිත කාමරයක් ද,

''හෝටලය'' යන්නෙන්, විකිණීම සඳහා පිසූ බත් සහ ව්‍යාංජන පිළියෙල කරන හෝ තබාගන්නා හෝ ප්‍රදර්ශනය කරන ස්ථානයක්, ආහාර වේලක් සඳහා කෑමට සුදුසු වෙනත් කවර හෝ පිළියෙල කළ ආහාර වර්ගයක් හෝ කිසියම් කෙටි ආහාර වර්ගයක් විකිණීම සඳහා පිළියෙල කරන හෝ තබා ගන්නා හෝ ප්‍රදර්ශනය කරන

ස්ථානයක් හෝ එකී කාර්යයන් සමග ගනුදෙනුකරුවන් නවාතැන් ගැනීමට ඉඩකඩ සලස්වා ඇති ස්ථානයක් අදහස් වේ.

"බලපත්‍ර ලාභියා " යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු ද,

"බලපත්‍ර ලත් ස්ථානය " යන්නෙන්, මෙහි කවර අතුරු ව්‍යවස්ථාවක නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම් ස්ථානයක් පාවිච්චි කිරීමට ද එකී ස්ථානය ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන් තත් කාර්යය සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති කුරුණෑගල මහා නගර සභාවේ යම් නිලධාරියෙකු ද අදහස් වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන් එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස් වේ.

## උපලේඛනය I

(4 වන අතුරු ව්‍යවස්ථාව)

***නවාතැන් පොළක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රය***

01. ඉල්ලුම්කරුගේ නම : .........................
    ලිපිනය : .........................
    ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය : .........................

02. නවාතැන්පොළෙහි නම : .........................
    ලිපිනය :.........................
    කළමනාකරුගේ/භාරකරුගේ නම :.........................
    දුරකථන අංකය :.........................

03. බලපත්‍රය ඉල්ලා සිටින වර්ෂය : .........................

04. නවාතැන් පොළෙහි -
    (i) තනි කාමර සංඛ්‍යාව :.........................
    (ii) යුගල කාමර සංඛ්‍යාව :.........................
    (iii) ත්‍රිත්ව කාමර සංඛ්‍යාව :.........................
    (iv) පවුල් කාමර සංඛ්‍යාව :.........................
    (v) එකවර නවාතැන් ගත හැකි සම්පූර්ණ සංඛ්‍යාව :.........................

05. නවාතැන් පොළෙහි නියුක්ත සේවක සංඛ්‍යාව (කළමනාකරු ද සමග) :.........................

05. වැසිකිළි -
    (i) පිරිමි සේවක වැසිකිළි සංඛ්‍යාව :.........................
    (ii) පිරිමි සේවක කැසිකිළි සංඛ්‍යාව :.........................
    (iii) කාන්තා සේවක වැසිකිළි සංඛ්‍යාව :.........................
    (iv) ගණුදෙනුකාර පිරිමි වැසිකිළි සංඛ්‍යාව :.........................
    (v) ගණුදෙනුකාර පිරිමි කැසිකිළි සංඛ්‍යාව :.........................
    (vi) ගණුදෙනුකාර කාන්තා වැසිකිළි සංඛ්‍යාව :.........................

06. නාන කාමර -
    (i) පිරිමි නාන කාමර සංඛ්‍යාව :.........................
    (ii) කාන්තා නාන කාමර සංඛ්‍යාව :.........................

07. මුළුතැන් ගෙවල් සංඛ්‍යාව :.........................
08. ජල සම්පාදන ප්‍රභවය :.........................
09. ඝන අපද්‍රව්‍ය, අවසන් බැහැර කිරීම සිදුකරන ක්‍රමවේදය :.........................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. නවාතැන් පොළ විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පිළිපැදීමට එකඟ වෙමි. එකී අතුරු ව්‍යවස්ථා යටතේ ඉහත නම් සඳහන් නවාතැන්පොළ පවත්වාගෙන යාම සඳහා 20 ............... වර්ෂය වෙනුවෙන් බලපත්‍රයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

................................
අයිතිකරු/කළමනාකරු/භාරකරුගේ අත්සන.

20................................... දින.

06-645/5

## කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය තුළ හෝටල් පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

252 හා අධිකාරිය වන 1947 අංක 16 දරන නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියේ පළවන උපවගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥාපනතේ 272 වන වගන්තියේ (22) වන උපවගන්තියෙන් මහා නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව කුරුණෑගල මහා නගර සභාව විසින් සාදනු ලැබූ සහ 2014.09.30 පැවති එකී මහා නගර සභාවේ 4(10) දරන යෝජනාවෙන් සභා සම්මත වී ඇති මෙහි පහත උපලේඛනයෙන් දැක්වෙන කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය තුළ හෝටල් පවත්වාගෙන යාම විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික) විධිවිධාන පනතේ දෙවන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී මහා නගර සභා ආඥාපනතේ 268 වන වගන්තියේ (1) වන උප වගන්තිය ප්‍රකාරව වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය දයාසිරි ජයසේකර වන මවිසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නීතිඥ ජේ. පී. දයාසිරි පද්මකුමාර ජයසේකර,
වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍ය,

2015 ජූනි මස 05 වැනි දින,
වයඹ ප්‍රධාන අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

උපලේඛනය

### කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය තුළ හෝටල් පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. මෙම අතුරු ව්‍යවස්ථා මහා නගර සභා බල ප්‍රදේශය තුළ හෝටල් විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

අරමුණ

2. මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පවත්වාගෙන යාම අරමුණු කොටගෙන මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කොට ඇත.

අතුරු ව්‍යස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

3. මහා නගර සභා ආඥා පනතේ 267(1) සමඟ කියවිය යුතු 272(22) උපවගන්තියේ සඳහන් පරිදි නෛතික විධිවිධාන අනුව මෙම අතුරු ව්‍යවස්ථාව සකස් කර ඇත.

ඉටු කළ යුතු කාර්යයන්

4. උපලේඛන 1 හි දැක්වෙන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් වාර්ෂික බලපත්‍රයක් ලබාගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය සහ වගකීම වන්නේය.

5. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ හෝටලයකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(1) ස්ථානය මනා අළුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(2) ස්ථානයේ සෑම කාමරයක ම බිත්ති මීටර් 2.5කට නොඅඩු උසකින් යුක්ත විය යුතු අතර එකී බිත්ති ගඩොලෙන්, සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් තනා තිබිය යුතු අතර දෙපැත්ත ම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය. එසේ වුව ද මුළුතැන්ගේ හැර වෙනත් කාමර ලීයෙන් හෝ කිසියම් ලෝහ තහඩු වර්ගයකින් හෝ ලී හා කිසියම් ලෝහ තහඩු වර්ගයකින් තනා තීන්ත ආලේප කර තිබීම මේ නියමයට අනුකූලවන ලෙස සැලකිය යුතු ය.

(3) ස්ථානයේ සෑම කාමරයක ම සීලිමක් බැගින් සවිකර තිබිය යුතු අතර එකී සීලිම පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5 කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(4) සෑම කාමරයකට ම විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කළ විට ඒ ජනේලවල කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ගඵලයෙන් පහළොවෙන් එකකට නොඅඩු විය යුතු ය. එසේ වුව ද කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාළ නොවිය යුතු ය.

(5) වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු ය.

(6) පියසි කෙළවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2 කට උසින් පිහිටා තිබිය යුතු අතර අගු වාසිය අවම වශයෙන් මීටර් 1.5ක් විය යුතු ය.

(7) සෑම කාමරයක ම බිම සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(8) ස්ථානය තුළ ජනනය වන කසළ රැස්කිරීම සඳහා කසළ භාජන තබා තිබිය යුතු අතර මුළුතැන්ගෙය තුළ තබන කසළ භාජන මැස්සන් හෝ වෙනත් කෘමි සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් තිබිය යුතු ය.

(9) ස්ථානය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා 17 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමයන් අනුව ක්‍රියා කළ හැකි ආකාරයට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(10) ස්ථානයේ මුළුතැන්ගෙය තුළ පාවිච්චියට ගනු ලබන සෑම මේසයක් ම -

(අ) ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර, එකී මේසය මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(ආ) යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(11) ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට තබා ඇති සෑම මේසයක් ම -

(අ) ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර එකී මේසය මතුපිට වීදුරු තහඩුවකින් හෝ ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(ආ) යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර වීදුරු තහඩුවකින් හෝ මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(12.) ස්ථානයේ පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර අවම වශයෙන් සෑම මාස හයකට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතු ය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය ස්ථානයේ පාවිච්චිය සඳහා යොදා ගන්නේ නම් එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(13) ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම් එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(14) ගණුදෙනුකරුවන් විසින් පාවිච්චියට ගනු ලැබූ භාජන සේදීම සඳහා වෙනම කොටසක් ස්ථානයේ පවත්වාගෙන යා යුතු ය.

(15) ගණුදෙනුකරුවන්ගේ සහ සේවකයන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දහදෙනෙකුට එකක් බැගින් වනසේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වන වැසිකිළි හා කැසිකිළි තනා තිබිය යුතු ය.

(16) සෑම වැසිකිළියක හා කැසිකිළියක ම බිත්ති ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් කබුක් ගලෙන් හෝ මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් තනා බිම සිමෙන්තියෙන් කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය. එසේ ම තවදුරටත් ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් තැනූ බිත්ති වන විට ඒවා කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු වන අතර මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් තැනූ බිත්ති වනවිට ඒවා මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(17) ස්ථානයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ පාවිච්චිය සඳහා නාන කාමර ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු අතර (16) වැනි ඡේදයේ සඳහන් වැසිකිළිවලට අදාළ නියමයන් එකී නාන කාමරවල බිමට සහ බිත්තිවලට අදාළ විය යුතු ය.

(18) ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට වෙන්කළ කොටස තුළ ගනුදෙනුකරුවන්ගේ අත් සේදීමට මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් හෝ පිඟන් මැටියෙන් තනා ඔපදැමූ හෝ ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් බැඳ පිඟන් ගඩොල් ඇල්ලූ බේසම් තනා තිබිය යුතු ය.

(19) ස්ථානයේ කවර හෝ කොටසක පාවිච්චියෙන් පසු බැහැර කරන අප ජලය අවහිරයකින් තොරව ගලා යාමට සුදුසු කාණු පද්ධතියක් ඇතිකර තිබිය යුතු ය.

(20) මහ නගර සභාව විසින් ජලාපවහන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන්නේ නම් ස්ථානයෙන් බැහැර කරන අප ජලය මහ නගර සභාව විසින් නියම කරනු ලබන ආකාරයෙන් එකී ජලාපවහන පද්ධතියට ගලා යාමට සැලැස්විය හැකි අතර, එසේ නොවන අවස්ථාවක එකී අප ජලය උරා ගන්නා වලකට ගලා යාමට සලස්වා තිබි යුතු ය.

(21) ස්ථානයේ සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු අතර ස්ථානයට විදුලිය සම්බන්ධතාව ලබාගෙන ඇත්නම් අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය.

(22) ස්ථානයේ තේ, කෝපි හෝ කිරි පිළියෙල කරනු ලබන කොටස පිරිද්දුම් නැති මළ නොබැඳෙන ලෝහ තහඩුවකින් හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ආවරණය කර තිබිය යුතු ය.

(23) ස්ථානයේ ගනුදෙනුකරුවන්ට හා සේවකයන්ට නිදාගැනීමට වෙන්කළ නිදන කාමරවල එක් තැනැත්තෙකුට නිදා ගැනීමට වෙන්කළ ඉඩ ප්‍රමාණය අවම වශයෙන් මීටර් හතරකට නොඅඩු විය යුතු ය.

6. තීන්ත ආලේප කර තිබිය යුතු යයි සහ 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති සෑම කොටසක ම අවම වශයෙන් අවුරුද්දකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

7. බලපත්‍රලත් ස්ථානය අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් ඇමදීම කළ යුතු අතර, අප ජලය බැසයන කාණු අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර ජලයෙන් සෝදා හැරීම කළ යුතු ය.

8. බලපත්‍රලත් ස්ථානයෙහි රාත්‍රිය නතර වී සිටීමට පැමිණෙන එක් එක් තැනැත්තාගේ නම, ලිපිනය හා අනන්‍යතාව සටහන් කරන ලේඛනයක් සෑම බලපත්‍රලත් ස්ථානයකම පවත්වා ගත යුතු අතර, නාගරික කොමසාරිස්වරයා, බලයලත් නිලධාරියා හෝ කිසියම් පොලිස් නිලධාරියෙකු විසින් පරීක්ෂා කිරීමට ඉල්ලා සිටින අවස්ථාවක එකී ලේඛනය පරීක්ෂා කිරීමට ඉඩ දීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

9. බලපත්‍රලත් ස්ථානයේ සෑම නිදන කාමරයක ම එක් ගණුදෙනුකරුවකු විසින් පාවිච්චි කරනු ලැබීමෙන් අනතුරුව තවත් ගනුදෙනුකරුවකුගේ පාවිච්චියට ඉඩදීමට පෙර එකී නිදන කාමරයේ ඇඳ ඇතිරිලි, කොට්ට උර, පොරෝනා, තුවා සහ පාවිච්චි කළ වෙනත් රෙදි සෝදා පිරිසිදු කිරීමෙන් අනතුරුව මිස අනෙක් ගණුදෙනුකරුවකුගේ පාවිච්චියට සැලැස්වීම නොකළ යුතුවාත් හැර පසුව පැමිණෙන ගනුදෙනුකරුවාට එකී කාමරය පාවිච්චි කිරීමට ඉඩ දීමට පෙර එකී කාමරයේ ජනේල අවම වශයෙන් පැය හතරක් වත් සම්පූර්ණයෙන් විවෘත කර තැබීමට සැළැස්විය යුතු ය.

10. සෑම බලපත්‍රලත් ස්ථානයකම සෑම කාමරයක්, හිණිපෙලක්, ආලින්දයක්, කාණුවක් සහ එකී ස්ථානයට අයත් ඉඩම ද සෑම දිනක ම මධ්‍යහ්නයට පෙර අතු ගෑමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේ ය.

11. බලපත්‍රලත් ස්ථානයේ ඇති වැසිකිළි සහ කැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර විෂබීජ නාශක යෙදීම කළ යුතු අතර, දුර්ගන්ධය වහනය වීමෙන් තොරව පවත්වා ගත යුතු ය. එසේ වුව ද ගනුදෙනුකරුවන් නවාතැන් ගන්නා කිසියම් කාමරයක වැසිකිළි දිනකට එක් වරක් පිරිසිදු කිරීම ප්‍රමාණවත් ලෙස සැලකිය හැකි ය.

12. බලපත්‍රලත් ස්ථානයේ ආහාර පාන පිළියෙල කිරීමට, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට සහ ගණුදෙනුකරුවන්ගේ පාවිච්චියට ගනු ලබන භාණ්ඩ, භාජන හා උපකරණ සෑම එකක් ම ඒවා පාවිච්චියට ගැනීමට පෙර පිරිසිදු ජලයෙන් සෝදා ගත යුතු අතර, පාවිච්චි කිරීමෙන් පසුව සෝදා පිරිසිදු කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13. බලපත්‍රලත් ස්ථානයේ ඒ ඒ කොටසේ එකතු වන සියලුම කසළ 19 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ආකාරයෙන් වර්ග කර අපාරගම්‍ය ද්‍රව්‍යයකින් තැනූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු අතර, එකී කසළ අවම වශයෙන් එක් වරක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් ඒ ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර, එකී භාජනවලට කසළ බහාලන අවස්ථාවේ දී හා ඉවත් කිරීමේ දී හැර අන් සියලු වේලාවන් වල දී එම භාජනය හොඳින් වසා තැබිය යුතු ය.

14. *(අ)* බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අප ද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය ;
(ii) වීදුරු ;
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය ;
(iv) පොලිතින් හා ප්ලාස්ටික් හෝ පොලිතින් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය ;
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස් ;
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ;
(vii) අන්තරායකර අපද්‍රව්‍ය,

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර , ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

*(ආ)* ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය මහ නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

15. සෑම බලපත්‍රලත් ස්ථානයක් ම මීයන්ගෙන්, මැස්සන්ගෙන් හෝ වෙනත් කෘමීන්ගෙන් තොරව පවත්වා ගතයුතු අතර , එකී ස්ථානයේ තබා ගන්නා ආහාර හෝ පාන පිළියෙල කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය හා පිළියෙල කළ ආහාර හෝ පාන එකී සතුන්ගෙන් දූෂණය වීම වැළැක්වීමට අවශ්‍ය සියලුම විධිවිධාන සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

16. ගණුදෙනුකරුවන්ට ආහාර පිළිගැන්වීමේ දී ඒවා අතින් ඇල්ලීම නොකළ යුතු අතර, එකී ආහාර පිළිගැන්වීම සඳහා හැන්දක් හෝ ගෑරුප්පුවක් හෝ වෙනත් ආකාරයක උපකරණයක් යොදා ගත යුතු ය.

17. බලපත්‍රලත් ස්ථානයේ ආහාර හෝ පාන පිළියෙල කිරීමේ නියුක්ත සෑම සේවකයෙකු වෙත ම පිළිවැසුම් සපයා තිබීමත්, එකී සේවකයන් කාර්යයේ නියුක්තවන සෑම අවස්ථාවකම එකී පිළිවැසුම් පැළඳ සිටන බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

18. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහාම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතු ය.

19. නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් මහ නගර සභා බල ප්‍රදේශය තුළ හෝටලයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය. නොකළ යුතු කාර්යයන්

20. බලපත්‍රලත් ස්ථානයෙහි නිදන කාමර වශයෙන් නිශ්චිතව වෙන් කර ඇති කාමරයක හැර වෙනත් කිසියම් කාමරයක කවර හෝ තැනැත්තකුට නිදගැනීමට ඉඩදීම නොකළ යුතුය.

21. 5 වන අතුරු ව්‍යවස්ථාවේ (23) වන ඡේදයේ සඳහන් අවම ඉඩ ප්‍රමාණයට නොසැසඳෙන තැනැත්තන් සංඛ්‍යාවක් යම් නිදන කාමරයක නිද ගැනීමට බලපත්‍රලාභියා විසින් ඉඩදීම නොකළ යුතු ය.

22. බලපත්‍රලත් ස්ථානයේ කිසියම් නිදන කාමරයක, ආහාර පිළියෙල කරනු ලබන ස්ථානයක හෝ ආහාර ගැනීමට වෙන්කළ කිසියම් කොටසක කවර හෝ සත්ත්වයකු තබා ගැනීම නොකළ යුතු ය.

22. බලපත්‍රලත් ස්ථානයේ ඉවත දමන කසළ කවර හෝ අවස්ථාවක බිම හෝ තැනින් තැන දැමීම නොකළ යුතු ය.

23. කවර හෝ බලපත්‍රලත් ස්ථානයක බාල කළ කිරි කිසිවක් තබා ගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතු ය. මේ අතුරු ව්‍යවස්ථාව් කාර්යය සඳහා බාල කළ කිරි යන්නෙන් ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයන් එකතු කළ කිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 85 කට අඩු හෝ කිරි මේද සියයට 35කට අඩු එළකිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 9 ක හෝ කිරි මේද සියයට 7 කට අඩු මී කිරි අදහස් වේ.

24. *(අ)* කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තකුගේ සහායකයකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය ;

*(ආ)* හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය;

*(ඇ)* බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතු ය.

25. නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බලපත්‍රලත් ස්ථානයක පිළියෙල කරන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබාගැනීම නිත්‍යානුකුල විය යුතුවාක් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

26. මෙමෙ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස්වේ. පළාත් පාලන ආයතනයේ කාර්යභාරය

27. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් හෝටලයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය, ඒ නියමයට අනුකූල තත්ත්වයකට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

**අයකිරීම් හා ගාස්තු**

28. කිසියම් හෝටලයක් පවත්වාගෙන යාම සඳහා මහා නගර සභා ආඥා පනතේ 247(අ) 2 උපවගන්තියේ සඳහන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට සභාවට බලය ඇත්තේ ය.

**බලය පැවරීම**

29. මෙහි බලය පැවරීම මෙම අතුරු ව්‍යවස්ථාව නියමනය කිරීම සම්බන්ධයෙන් එහි නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේ ය.

**බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය**

30. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතු ය.

**පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය**

31. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස්වේ.

32. අතුරු ව්‍යවස්ථාවේ 25 හි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතරකට නොවැඩි විය යුතු ය.

**පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය**

33. යම් කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචිකව මහා නගර සභාවේ නගරාධිපති, නාගරික කොමසාරිස් හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබා දෙන්නේ ය.

**අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම**

34. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේ ය.

**දඩ හා දණ්ඩන**

35 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමසාරිස්වරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

36. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් කවර හෝ විධිවිධානයක් කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252වන අධිකාරය වූ මහ නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි (3) වගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන් ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී 267 වන වගන්තියෙහි (3) උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

**අර්ථ නිරූපනය හා නිර්වචන**

37. 29, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල —

"නගරාධිපතිවරයා " යන්නෙන් කුරුණෑගල මහ නගර සභාවේ නගරාධිපතිවරයා හෝ නගරාධිපතිවරයාගේ බලතල කාර්ය හා කර්තව්‍ය පැවරී ඇති යම් තැනැත්තෙක් ද අදහස්වේ.

"නියෝජ්‍ය නගරාධිපතිවරයා " යන්නෙන් කුරුණෑගල මහා නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපතිවරයා ද,

"නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, කුරුණෑගල මහ නගර සභාවේ කොමසාරිස්වරයා හෝ එකී කොමසාරිස්වරයාගේ බලතල කාර්යය හා කර්තව්‍ය පැවරී ඇති යම් නිලධාරියෙකු ද,

"මහ නගර සභාව" යන්නෙන්, කුරුණෑගල මහ නගර සභාව ද අදහස්වේ.

"හෝටලය" යන්නෙන්, විකිණීම සඳහා පිසූ බත් සහ ව්‍යාංජන පිළියෙල කරන හෝ තබා ගන්නා හෝ ප්‍රදර්ශනය කරන ස්ථානයක් ආහාර වේලක් සඳහා කෑමට සුදුසු වෙනත් කවර හෝ පිළියෙල කළ ආහාර වර්ගයක් හෝ කිසියම් කෙටි ආහාර වර්ගයක් විකිණීම සඳහා පිළියෙල කරන හෝ තබා ගන්නා හෝ ප්‍රදර්ශනය කරන ස්ථානයක් හෝ එකී කාර්යයන් සමග ගනුදෙනුකරුවන්ට නවාතැන් ගැනීමට ඉඩකඩ සලස්වා ඇති ස්ථානයක් අදහස් වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු ද ;

"බලයලත් ස්ථානය" යන්නෙන්, මෙහි කවර අතුරු ව්‍යවස්ථාවක නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම් ස්ථානයක් පාවිච්ච කිරීමට ද එකී ස්ථානය ද

"බලයලත් නිලධාරියා " යන්නෙන්, තත්කාර්යය සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් "ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති " කුරුණෑගල මහා නගර සභාවේ යම් නිලධාරියෙකු ද අදහස්වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස්වේ.

**උපලේඛනය**

*කුරුණෑගල මහ නගර සභාව*

**වෙළඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20........... වර්ෂය**

1. කර්මාන්තය/වෙළඳාම හිමිකරුගේ නම : ...........................................
2. පෞද්ගලික ලිපිනය : ...........................................
3. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |
4. දුරකථන අංකය ඃ ජංගම : ........................................... නිවාස : ...........................................
5. කර්මාන්තයේ/වෙළඳ ව්‍යාපාරයේ නම : ...........................................
6. කර්මාන්තයේ /වෙළඳාමේ ස්වභාවය : ...........................................

   කර්මාන්තය/වෙළඳාම කරන ස්ථානයේ :
   (අ) ලිපිනය : ...........................................
   (ආ) වීථියේ/පාරේ නම : ...........................................
   (ඇ) වරිපනම් අංකය : ...........................................
   (ඉ) දුරකථන අංකය : ...........................................
7. කර්මාන්තය/වෙළඳාම කරගෙන යන ස්ථානය අයත් ග්‍රාම නිලධාරි
   කොට්ඨාසයේ අංකය : ...........................................
   කොට්ඨාසයේ නම : ...........................................
8. ව්‍යාපාර නාම ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් එහි යොමු අංකය : ...........................................
9. කර්මාන්තය/වෙළඳාම කරගෙන යන ස්ථානයේ කළමණාකරුගේ/නියෝජිතයාගේ නම : ...........................................
10. ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | |
11. දුරකථන අංක ඃ ජංගම : ...........................................
    නිවස : ...........................................

නාගරික කොමසාරිස්,
කුරුණෑගල.

ඉහත තොරතුරු සඳහන් කර්මාන්තය/වෙළඳාම පවත්වාගෙන යන ස්ථාන සඳහා 20............ වර්ෂය වෙනුවෙන් කර්මාන්ත/වෙළඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීති වලට මම එකඟ වෙමි.

දිනය : 20.................

....................................,
ඉල්ලුම්කරුගේ අත්සන.

---

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ආදායම් පරීක්ෂක,

පසුපිටේ සඳහන් ඉල්ලුම්පත්‍රයට අදාළව වෙළඳ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණය හා නිර්දේශය කඩිනමින් මා වෙත ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

දිනය : 20..................

....................................,
නාගරික ගණකාධිකාරී.

---

නාගරික ගණකාධිකාරී,

බලපත්‍රය ලබාදීම නිර්දේශ කරමි/නොකරමි.

....................................,
ආදායම් පරීක්ෂක.

---

ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/නාගරික ඉංජිනේරු,

පසුපිටේ සඳහන් ඉල්ලුම්පත්‍රයට අදාළව වෙළඳ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණය හා නිර්දේශය කඩිනමින් ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

....................................,
නාගරික ගණකාධිකාරී.

දිනය ...................................

---

ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි,

අතුරු ව්‍යවස්ථා හා අනෙකුත් නීති රීති වලට අනුකූලව සුදුසුකම් සපුරා ඇත. බලපත්‍රය නිකුත් කිරීම නිර්දේශ කිරීම සඳහා වාර්තා කරමි.

...................................,
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

දිනය : 20 .....................

නාගරික ඉංජිනේරු,

භාවිතය වෙනස් කර ඇත/නැත. අනුකූලතා සහතිකය ලබාගෙන ඇත/නැත. බලපත්‍රය නිකුත් කිරීම නිර්දේශ කිරීම සඳහා වාර්තා කරමි/නොකරමි.

....................................,
කාර්මික නිලධාරී.

දිනය ...................................

නාගරික ගණකාධිකාරි,

ඉහත ඉල්ලුම් පත්‍රයට අනුව අදාළ ස්ථානය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි/නොකරමි. (නිර්දේශ නොකරන්නේ නම් ඊට අදාළ හේතුව සඳහන් කරන්න.)

දිනය : ......................

..................................
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි
නාගරික ඉංජිනේරු
(නිල මුද්‍රාව තබන්න)

---

වෙළඳ බලපත්‍ර විෂය භාර නිලධාරි,

1. කර්මාන්තය/වෙළඳාම පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. ...................... කි.

2. කර්මාන්තය/වෙළඳාම පවත්වාගෙන යනු ලබන ස්ථානය වෙනුවෙන් හිඟ වරිපනම් අය කර ගෙන ඇත/නැත.

3. කර්මාන්තය වෙළඳාම කරන ස්ථානයේ,

   (අ) වීථියේ /පාරේ නම : ......................
   (ආ) වරිපන්ම අංකය : ......................

දිනය : ......................

..................................,
වරිපනම් විෂය භාර නිලධාරි.

---

නාගරික ගණකාධිකාරි,

1. අයකළ යුතු බලපත්‍ර ගාස්තුව රු. ...................... කි.

2. බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය ..................................

..................................,
වෙළඳ බලපත්‍ර විෂයභාර නිලධාරි

නාගරික කොමසාරිස්,

ඉල්ලුම්පත්‍රය පිළිබඳ ඉහත නිර්දේශය සමඟ එකඟ වෙමි. බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

දිනය : ..................................

..................................
නාගරික ගණකාධිකාරි,
(නිල මුද්‍රාව තබන්න).

නාගරික ගණකාධිකාරි,

අනුමත කරමි.

දිනය ..................................

..................................,
නාගරික කොමසාරිස්,
(නිල මුද්‍රාව තබන්න)

---

නාගරික ගණකාධිකාරි,

අයකරගත් බලපත්‍ර ගාස්තුව

රු. ..................................

ලදුපත් අංකය .................................. දිනය ..................................

පිළියෙල කළ බලපත්‍රයේ අංකය.................................. දිනය ..................................

බලපත්‍රය ලබාගත යුතු ආයතනය ලේඛනයේ සටහන් කර ඇත./ පරිගණක ගත කර ඇත.

බලපත්‍රය නාගරික කොමසාරිස්ගේ අත්සනට ඉදිරිපත් කරමි.

දිනය ..................................

..................................,
වෙළඳ බලපත්‍ර විෂය භාර නිලධාරි.

---

නාගරික කොමසාරිස්,

මෙම බලපත්‍රය පනවා ඇති වෙළඳ බලපත්‍ර ගාස්තු අයකිරීමේ ගැසට් පත්‍රයට අනුකූලව සකස් කර ඇත.

බලපත්‍රය අත්සනට ඉදිරිපත් කරමි.

දිනය ..................................

..................................,
නාගරික ගණකාධිකාරි.

---

නාගරික ගණකාධිකාරි,

බලපත්‍රය අත්සන් කරන ලදී.

දිනය ..................................

..................................,
නාගරික කොමසාරිස්/නාගරික කොමසාරිස්
වෙනුවට,
නිල මුද්‍රාව තබන්න.

* අදාළ නොවන වචන කපා හරින්න.

06-645/6

## කුරුණෑගල මහා නගර සභාවට අයත් මාර්ගවලට අලාභ හානි කිරීම සහ මාර්ගවල ගමනාගමනයට බාධා කිරීම වැලැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

252 හා අධිකාරිය වන 1947 අංක 16 දරන මහ නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියේ පළවන උපවගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 272 වන වගන්තියේ (06) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙන් මහ නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව, කුරුණෑගල මහා නගර සභාව විසින් සාදනු ලැබූ සහ 2014.09.30 පැවති එකී මහා නගර සභාවේ 4(01) දරන යෝජනාවෙන් සභා සම්මත වී ඇති මෙහි පහත උපලේඛනයෙන් දැක්වෙන කුරුණෑගල මහා නගර සභාවට අයත් මාර්ගවලට අලාභහානි කිරීම හා මාර්ගවල ගමනාගමනයට බාධාකිරීම වැලැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික) විධිවිධාන පනතේ දෙවන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී මහා නගර සභා ආඥාපනතේ 268 වන වගන්තියේ (1) වන උප වගන්තිය ප්‍රකාරව, වයඹ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය දයාසිරි ජයසේකර වන මවිසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නීතිඥ ජේ. පී. දයාසිරි පද්මකුමාර ජයසේකර,
වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍ය,

2015 ජූනි මස 05 වැනි දින,
වයඹ ප්‍රධාන අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

උපලේඛනය

### කුරුණෑගල මහා නගර සභාවට අයත් මාර්ගවලට අලාභහානි කිරීම සහ මාර්ගවල ගමනාගමනයට බාධා කිරීම වැළැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. අතුරු ව්‍යවස්ථා මහා නගර සභාවට අයත් මාර්ගවලට අලාභහානි කිරීම සහ මාර්ගවල ගමනාගමනයට බාධාකිරීම වැළැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ. — අතුරු ව්‍යවස්ථාවේ නාමය.

2. කුරුණෑගල මහා නගර සභාවට අයත් මාර්ගවලට හානි කිරීම අවම කිරීම හා මාර්ගවල ගමනාගමනයට බාධාවීම වැලැක්වීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් නියාමනය කිරීම හා පාලනය කිරීම අරමුණ වේ. — අරමුණ.

3. මහා නගර සභා ආඥාපනතේ 267 (1) වගන්තිය සමග කියවිය යුතු 272 6 (ඇ) උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත. — අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන.

4. කිසියම් මාර්ගයක් ඔස්සේ ඇති කාණුවක් ගොඩ කිරීම හෝ ඊට හානි කිරීම හෝ එකී කිසියම් කාණුවක් දිගේ ගලායන ජලය පහසුවෙන් ගලායාමට බාධා කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුවාත් හැර එකී කාණුවක් හරහා කිසියම් ඉඩමකට ඇතුල්වීමට අවශ්‍ය වන්නේ නම් දිගින් මීටර් එකකට නොඅඩු වන පාලමක්, වේදිකාවක් හෝ ආරුක්කුවක් තැනීම එකී ඉඩමේ අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ කාර්යය විය යුතු ය. — ඉටුකළ යුතු කාර්යයන්.

5. කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභාව සතු යම් මාර්ගකට හානි පැමිණවීම නොකළ යුතු අතර, මාර්ගයේ ගමන් ගන්නා වාහනවලට හෝ පදිකයන්ට බාධාවන ආකාරයෙන් මාර්ගයේ - — නොකල යුතු කාර්යයන්

   *(අ)* වෙළඳාම් කිරීම,
   *(ආ)* ඉවත් කරගෙන යාම සඳහා පන ගැන්වීමට හෝ වෙනත් ආපදාවක් හේතුවෙන් බැහැරට පදවාගෙන යාමට නොහැකිවන කිසියම් හේතුවක් වන්නේ නම් මිස xxvi වන කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ මහා නගර සභාව විසින් වාහන නතර කිරීමට ඉඩ දීමට තීරණය කරනු ලැබූ කිසියම් කොටසක් නොවන ස්ථානයක වාහන නතර කර තැබීම.
   *(ඇ)* වාහන අළුත්වැඩියා කිරීම හෝ වාහන සේදීම,
   *(ඈ)* කිසියම් මාර්ගයක කෙරෙන යම් අළුත්වැඩියාවක් සඳහා මහා නගර සභාවේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ තීරණයක් මත කෙරෙන කාර්යයක දී හැර ගල්, වැලි, බොරළු, පස්, ගඩොල් හෝ ලී කොට බෑම හෝ රඳවා තැබීම,
   (ඉ) ගර්හිත වාහන කොටස් රඳවා තැබීම,

   නොකළ යුතු ය.

6. නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ විධිවිධාන යටතේ පළලින් අඩි පනහකට (මීටර් 16.7කට) වැඩියෙන් වන මාර්ගයක් සඳහා වීථි රේඛා නියම කරනු නොලැබූ යම් මාර්ගයක මධ්‍ය රේඛාවේ සිට අඩි විසි පහක් (මීටර් 3.18ක්)ඇතුළත කවර හෝ ආකාරයක ඉදිකිරීමක් කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු අතර, වෙනත් යම් ඉදිකිරීමක් කවර හෝ තැනැත්තෙකු විසින් නොකළයුතු අතර, වෙනත් යම් ඉදිකිරීමක් සඳහා ගෙන එන ලද කවර හෝ ඉදිකිරීම් ද්‍රව්‍යයක් කිසියම් මාර්ගයක හෝ එහි යම් කොටසක තැබීම නොකළ යුතු ය.

7. අතුරු ව්‍යවස්ථා 11 යටතේ නාගරික කොමසාරිස්වරයා විසින් කරනු ලැබූ යම් නියෝගයකට පටහැනි ආකාරයෙන් ක්‍රියාකිරීම හෝ එකී යම් නියෝගයක ට අනුව ක්‍රියාකරන කිසියම් තැනැත්තෙකුට බාධාකිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

8. නාගරික කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබූ ලිඛිත අවසරයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභාව සතු කිසියම් මාර්ගයක රැඳී තිබෙන ගල්, බොරළු, වැලි, පස් හෝ වෙනත් කිසියම් ද්‍රව්‍යයක් එකතු කිරීම හෝ ගොඩගැසීම හෝ ඉවතට ගෙන යාම නොකළ යුතු ය.

9. කිසියම් ඉඩමකට හෝ ඉඩමක පිහිටා ඇති ගොඩනැගිල්ලක වහළයට පතිත වන වර්ෂා ජලය හැර වෙනත් කිසියම් ආකාරයකින් එකී ඉඩමේ හෝ ඉඩමේ පිහිටා ඇති ගොඩනැගිල්ලේ පවතින ජලය හෝ පාවිච්චියෙන් පසු බැහැර කෙරෙන අප ජලය, උරා ගන්නා වලකට ගලා යාමට සැලැස්විය යුතු අතර, මහ නගර සභාව සතු මාර්ගයකට හෝ මාර්ගයක් ඔස්සේ ඇති කාණුවකට බැහැර කිරීම නොකළ යුතු ය.

10. ප්‍රවාහනය කරනු ලබන ද්‍රව්‍යයන් හෝ දූවිලි හෝ වැලි හෝ කුඩා කැබලි වශයෙන් විසිරීම වළක්වන ආවරණයකින් ආවරණය කර ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් එවැනි කිසියම් ද්‍රව්‍යයක් මහ නගර සභාව සතු මාර්ගයක කිසියම් වාහනයකින් ප්‍රවාහනය කිරීම නොකළ යුතු ය.

**පළාත් පාලන ආයතනයේ කාර්යභාරය**

11. මහ නගර සභාව සතු කිසියම් මාර්ගයක් නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය කරන කාර්යයක් සඳහා -

(අ) එකී මාර්ගය සම්පූර්ණයෙන් ම හෝ මාර්ගයෙන් කොටසක් හෝ මාර්ගයේ කිසියම් දිසාවකට ධාවනය වන යම් මං තීරුවක් කිසියම් කාලයකට වාහන ගමනාගමනයට වසා තැබීමට.
(ආ) කිසියම් ඉදිකිරීම් ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍ය එකී මාර්ගයේ කිසියම් කොටසක ගොඩ ගැසීමට.
(ඇ) එකී මාර්ගයට යාබද ඉඩමකට ඇතුල්වීමට, ඉදිකිරීම් ද්‍රව්‍ය කිසිවක් එකී ඉඩමේ තැන්පත් කිරීමට,
(ඈ) එකී මාර්ගයට යාබද ඉඩමේ යම් දේපළකට හානියක් නොවන ආකාරයෙන් එකී ඉඩමෙන් වාහන ධාවනය සඳහා ඉඩ සැලැස්වීමට.
නියෝග කිරීම සඳහා නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය.

**බලය පැවරීම**

12. මෙහි බලය පැවරීම මෙම අතුරු ව්‍යවස්ථාව නියාමනය කිරීම සම්බන්ධයෙන් එහි නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් සභාවේ කවර හෝ නිලධාරියකුට පැවරීම නීත්‍යානුකූල වන්නේ ය.

**පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය**

13. නියමයක් යටතේ බලපත්‍ර ලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට පරීක්ෂා කිරීම සඳහා සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය. එසේ ම එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධාකිරීමක් නොකල යුතු ය.

**පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය**

14. යම්කිසි පැමිණිල්ලක් ලිඛිත ව හෝ වාචික මහා නගර සභාවේ නගරාධිපති නාගරික කොමසාරිස් හෝ බලයලත් නිලධාරියෙකු ට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබා දෙන්නේ ය.

**අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම**

15. අතුරු ව්‍යවස්ථා 6 සඳහන් නියමයන් උල්ලංඝනය කරමින් කවර හෝ තැනැත්තකු විසින් මහා නගර සභාව සතු යම් මාර්ගයක හෝ එහි කොටසක කිසියම් ඉදිකිරීම් ද්‍රව්‍යයක් තබනු ලැබ ඇති අවස්ථාවක නාගරික කොමසාරිස්වරයා විසින් හෝ බලයලත් නිලධාරියෙකු විසින් එකී ඉදිකිරීම් ද්‍රව්‍ය එකී ස්ථානයෙන් ඉවත් කිරීමට හෝ මහා නගර සභාව සතු කිරීමට ක්‍රියා කිරීම හෝ නීත්‍යානුකූල වන්නේය. නාගරික කොමසාරිස්වරයා විසින් හෝ බලයලත් නිලධාරියා විසින් ඉහත ආකාරයෙන් ක්‍රියා කිරීම හේතුවෙන් එකී ඉදිකිරීම් ද්‍රව්‍ය මාර්ගයේ තබන ලද හෝ තැබීමට සලස්වනු ලැබූ තැනැත්තාට සිදුවන යම් පාඩුවක් හෝ අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් එකී ද්‍රව්‍ය ඉවත් කිරීමට ක්‍රියා කළ තැනැත්තා හෝ මහා නගර සභාව වගකීමට යටත් නොවනු ඇත. එසේ ම තවදුරටත් එසේ ඉවත් කළ ද්‍රව්‍ය වෙනුවෙන් කවර හෝ ප්‍රමාණයක වන්දියක් ගෙවීමට මහා නගර සභාව හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා යටත් නොවනු ඇත.

**දඩ හා දණ්ඩන**

16. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේ ය.

**අර්ථ නිරූපනය හා නිර්වචන**

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස අතුරු ව්‍යවස්ථාවල -

"නගරාධිපතිවරයා " යන්නෙන් කුරුණෑගල මහා නගර සභාවේ නගරාධිපතිවරයා හෝ නගරාධිපතිවරයාගේ බලතල කාර්ය හා කර්තව්‍ය පැවරී ඇති යම් තැනැත්තෙක් ද අදහස්වේ.

"නියෝජ්‍ය නගරාධිපතිවරයා " යන්නෙන් කුරුණෑගල මහා නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපතිවරයා ද,

"නාගරික කොමසාරිස්වරයා " යන්නෙන් කුරුණෑගල මහා නගර සභාවේ කොමසාරිස්වරයා හෝ එකී කොමසාරිස්වරයාගේ බලතල කාර්යය හා කර්තව්‍ය පැවරී ඇති යම් නිලධාරියෙකු ද,

"මහ නගර සභාව" යන්නෙන්, කුරුණෑගල මහ නගර සභාව ද අදහස්වේ.

"මාර්ගය" යන්නෙන්, මහ නගර සභාව සතු කිසියම් මං මාවතක්, මාර්ගයක්, මහා මාර්ගයක්, පටුමඟක්, වීථියක්, දෙවැටක්, පඩි පෙළක්, ඒ දණ්ඩක් හෝ මගී පාලමක් අදහස් වන අතර, මහ නගර සභාව සතු කිසියම් මං මාවතකට, මාර්ගයකට, මහා මාර්ගයකට, පටුමඟකට, වීථියකට, දෙවැටකට, පඩි පෙළකට සම්බන්ධව සවිකර හෝ සිටුවා ඇති කිසියම් දුර පෙන්වන සළකුණක්, මායිම් ගලක්, මායිම් කණුවක්, පහන් කණුවක්, පාලමක්, කවර හෝ ආකාරයක් බෝක්කුවක්, දිය පැන්නුමක්, තාප්පයක්, ආරුක්කුවක්, වේල්ලක්, කාණුවක්, සොරොව්වක්, ආධාරක බැම්මක්, අත්වැලක්, දම්වැලක්, වැටක්, සංඥා පුවරුවක්, මාර්ග නාම පුවරුවක් හෝ මාර්ගයට යාබද පදික වේදිකාවක් ද ඊට ඇතුළත් විය යුතුය.

"වාහනය" යන්නෙන් රථවාහන ආඥාපනතේ ඊට දී ඇති අර්ථ නිරූපනය අදහස් විය යුතු අතර, කරත්තයක්, පාපැදියක් හෝ රෝද සවිකරන ලද යාන්ත්‍රික ව හෝ වෙනත් අයුරකින් ක්‍රියාකරනු ලබන උපකරණයක් ද අදහස් වේ ;

"හානි පැමිණවීම" යන්නෙන්, විනාශ කිරීම, ගලවා දැමීම, විකෘති කිරීම, පෙරලා දැමීම, බැහැර කිරීම, වෙනත් කවර හෝ ආකාරයෙන් හානි පැමිණවීම, කිසියම් කොටසක් මත පෝස්ටරයක් හෝ අත් පත්‍රිකාවක් ඇලවීම හෝ තීන්ත හෝ වෙනත් යම් ලාටු වර්ගයක් හෝ තාර ගෑම අදහස් වන අතර, කිසියම් නාම පුවරුවක අකුරු වෙනස් කිරීම, මකා දැමීම, සූරා දැමීම හෝ ගලවා දැමීම ද ඊට ඇතුළත් විය යුතු අතර, මහ නගර සභාව විසින් හෝ නාගරික කොමසාරිස්වරයා විසින් හෝ නාගරික කොමසාරිස්වරයාගෙන් බලයලත් යම් නිලධාරියෙකු විසින් හෝ කිසියම් මාර්ගයක් අළුත්වැඩියාවක් සඳහා කරවනු ලබන යම් කාර්යයක් ඊට ඇතුළත් නොවිය යුතු ය.

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බල පත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර, එකී බලපත්‍ර ලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු ද,

"බලපත්‍ර ලත් ස්ථානය" යන්නෙන්, මෙහි කවර අතුරු ව්‍යවස්ථාවක නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම් ස්ථානයක් පාවිච්චි කිරීමට ද එකී ස්ථානය ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති කුරුණෑගල මහා නගර සභාවේ යම් නිලධාරියෙකු ද අදහස්වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය " යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස් වේ.

06-645/7

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.